# ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය පිළිබඳ අධ්‍යයනයක්ඃ වයඹ පළාත් සභාව ඇසුරින්

ටී. පී. ක්‍රිෂ්ණාංජලී ප්‍රේමකුමාරි[18]

## සංක්ෂේපය

නූතන ලිබරල්වාදයේ එක් අපූර්වතම නිපයුමක් ලෙස නියෝජනය හඳුන්වාදිය හැකි ය. ශ්‍රී ලංකාවට යටත්විජිත යුගයේ එනම් 1931 හඳුන්වාදුන් ඩොනමෝර් ආණ්ඩුක්‍රමය තුළින් සර්වජන ඡන්ද බලය ලබා දුන් අතර එය ලාංකීය දේශපාලන ඉතිහාසයේ සන්ධිස්ථානයකි. ඒ හරහා ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව දේශපාලන කටයුතු වලට සහභාගී වීමට හැකියාව ලැබුණු අතර කාන්තාවටද දේශපාලනික වශයෙන් තීන්දු තීරණගැනීමේ ක්‍රියාවලියට සහභාගීවීමට හැකියාව ලැබිණි. දේශපාලන නියෝජනය ඇතුළු අනෙකුත් සියලුම දේශපාලන කටයුතු වලට සහභාගී වීම සඳහා වන අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් ප්‍රකාශනය හා ප්‍රඥප්ති මඟින් හිමි කර දී ඇති අතර එය ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි වගන්තියෙන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කරඇත. වෙනත් රටවලට සාපේක්ෂව ලංකාවේ කාන්තාවන්ට දේශපාලනික නිදහසක් තිබුණ ද ලාංකීය කාන්තාවන් තුළින් සක්‍රීය ලෙස දේශපාලන නියෝජනය දක්නට නොලැබෙන අතර ශ්‍රී ලංකාවේ කාන්තා නියෝජනය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි අරමුණ විය. රටේ ජනගහනයෙන් භාගයකට වඩා ප්‍රමාණයක් කාන්තාවන් වෙසෙන රටක් වුවද රටේ තීරණ ගන්නා අවස්ථා වලදීත් රාජ්‍ය ප්‍රතිපත්ති තීරණයේදීත් ශ්‍රී ලංකාවේ ස්ත්‍රී නියෝජනය අවම මට්ටමක පැවතීම නිසා ලංකාවේ දේශපාලනය තුළ කාන්තා නියෝජනය අඩු වීමට බලපෑ ඇති කාරණා මෙම අධ්‍යයනයේ ගැටළුව විය. අධ්‍යයනය ප්‍රාථමික දත්ත සහ ද්වීතියික මූලාශ්‍ර මත පදනම් වූ අතර ප්‍රාථමික දත්ත සහ තොරතුරු ලබා ගැනීමේ දී ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්චා උපයෝගී කර ගැණිනි. පර්යේෂණයේ ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යානමය විධි ක්‍රම ඔස්සේ ද ගුණාත්මක දත්ත විස්තරාත්මක දත්ත ඔස්සේ විශ්ලේෂණය කෙරේ. එහි දී ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය අවම වීමට ප්‍රමුඛ වූ කරුණු වූයේ ස්ත්‍රීන් සම්බන්ධව පවතින සමාජ සංස්කෘතික ආකල්ප, දේශපාලන තරඟයේදී සිදුවන චරිත ඝාතන, දේශපාලන පක්ෂ පුරුෂ මූලික වීම, දේශපාලන පවුල් පසුබිම, පවතින මැතිවරණ ක්‍රමය, දේශපාලන ප්‍රචණ්ඩත්වය, ආර්ථික අපහසුතා, දේශපාලන ක්‍රියාවලිය පිළිබඳ ඇති දැනුම හා ස්ත්‍රී පෞරුෂ වර්ධනය සම්බන්ධයෙන් ස්ත්‍රිය තුළම ඇති ඍණාත්මක ආකල්ප, හා ආර්ථික අපහසුතා වැනි ගැටලු රාශියක් බලපා ඇති බවයි.

**මුඛ්‍ය පද ඃ** *නියෝජනය, ස්ත්‍රී නියෝජනය, පළාත් සභා*

## හැඳින්වීම

මෙම පරිච්ඡේදය තුළින් ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය පිළිබඳව සාකච්චා කරන අතර එය ජාතික මට්ටමේදී හා පළාත් සභා හා පළාත් පාලන ආයතන තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය පිළිබඳව හා එහි ස්වභාවය මෙහිදී සාකච්චා කිරීමට බලාපොරොත්තු වේ. මේ අනුව ශ්‍රී ලංකාවේ සර්වජන ඡන්ද බලය ලැබීමෙන් පසු මැතිවරණ සහභාගීත්වයේ ඉහළ මට්ටමක් පැවතියත් පුරුෂ පක්ෂයේ දේශපාලන සහභාගීත්වයට සාපේක්ෂව කාන්තා දේශපාලන සහභාගීත්වයේ අඩු බවත් ජාතික මට්ටමේ මෙන්ම පළාත් මට්ටමෙන් සහ ප්‍රාදේශීය මට්ටමෙන් ද එහි තත්ත්වය පවතින බව පෙනීයයි.

[18] ශාස්ත්‍රවේදී දේශපාලන විද්‍යා (විශේෂ) තෙවන වසර

# ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය

## ස්ත්‍රී නියෝජනය

ශ්‍රී ලාංකික ඉතිහාසය ආරම්භයේ සිටම ස්ත්‍රීන් පොදු කටයුතුවලට සහභාගී වූ බව පුරාවෘත්තවලින් හෙළි වේ. අනුලා, සීවලි, සුගලා හා කළ්‍යාණවතී වැනි රැජිණියන් විසින්ද ලංකාව පාලනය කරනු ලැබ ඇත. යටත්විජිත යුගයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය, ආගමික පුනරුද ව්‍යාපාර, වාමාංශික ව්‍යාපාර තුළ මෙන්ම විජිත පාලකයින්ට එරෙහි වැඩ වර්ජනවලදීත් ලාංකීය ස්ත්‍රීන් විවිධ භූමිකා රඟපා තිබේ (ලියනගේ, 2011ඃ 8). එබැවින් ශ්‍රී ලංකාවේ දේශපාලන ආයතන තුළ ස්ත්‍රී නියෝජනය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය පිළිබඳ විමසීමක් කර බැලීම කළ යුතුය. එහි දී පෙනී යන කාරණයක් වන්නේ 19 වන සියවස පුරා එකතැන පල්වෙමින් පැවති දේශපාලනික තත්ත්වය 1920 වන විට යම් වෙනස්වීමකට පැවති බවයි. එම අවධිය වන විට පැවති ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ශ්‍රී ලාංකික ජනතාවගෙන් ඡන්ද බලය හිමිව තිබුණේ දේශීය ධනේශ්වර පංතියේ එක්තරා සීමිත පිරිසකට පමණි. නමුත් එසේ ඡන්ද බලය හිමිව තිබූ එම පවුල්වලම කිසිඳු ස්ත්‍රියකට එම අයිතිය හිමිවී නොතිබිණි. මෙම අවධිය තුළම සමාජයේ වෙනත් තලවල පිරිමින්ටද ඡන්ද අයිතිය ලබා දෙමින් ඡන්ද බලය හිමි පිරිමි පාර්ශවය පුළුල් කළත් කිසිඳු ස්ත්‍රියකට එම අවස්ථාවේදී වත් එම අයිතිය ලබා නොදුනි. ඡන්ද දායකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව පිළිගත් සුදුසුකම් මාලාවේ " කාන්තාවක් නොවිය යුතුය" යන වගන්තිය ද ප්‍රධාන කාරණයක් ලෙස ඇතුළත්කර තිබුණි (මඩහපොළ,2004ඃ13). මෙයින් පෙනී යන කාරණයක් ලෙස පෙනී යන්නේ ස්ත්‍රීන් එදා සිටම වෙනස්කොට සැළකීම් වලට ලක් කර ඇති ආකාරයයි.

ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට දේශපාලනයට සම්බන්ධ වීමට ප්‍රධාන වශයෙන් ව්‍යවස්ථාමය වශයෙන් ඉඩ සැලසුනේ මෙරටට සර්වජන ඡන්ද බලය හිමි වීමෙන් පසුවයි. 1910, 1920, 1924 ව්‍යවස්ථාදායක සභාවට තේරීපත් වීමට කාන්තාවන්ට ඡන්ද බලය හිමි නොවීය. 1931 දී අවුරුදු 21 නොවැඩි කාන්තාවන්ට ඡන්ද බලය හිමි වූ පළමු ආසියාතික රට වූයේ ශ්‍රී ලංකාවයි (ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, පර්යේෂණ අංශය, 2016 අගෝස්තු). ප්‍රථම වරට ශ්‍රී ලාංකික කාන්තාව දේශපාලන අයිතිවාසිකම් සඳහා ක්‍රියාත්මක වූයේ 1925 දීය. ලංකා ජාතික සංගමයේ වාර්ෂික රැස්වීමක දී මල්ලිකා කුලඟන සමිතිය නියෝජනය කළ ඇසිලින් තෝමස් ලාංකික කාන්තාවට සීමිත ඡන්ද බලයෙන් හෝ පවරන ලෙස ඉල්ලා සිටියාය. 1927 දී ඩොනමෝර් කොමිසම විසින් කාන්තාව වෙනුවෙන් එම කොමිසමට අදහස් ඉදිරිපත් කිරීම සඳහා කාන්තා සංවිධානයක් පිහිටුවා ගන්නා ලෙස යෝජනා කරන ලදී . ජෝර්ජ් ඊ ද සිල්වා, ඊ. ආර්. තම්බිමුත්තු හා සොලමන් ඩයස් බණ්ඩාරනායක යන නායකත්වයෙන් ඊට අනුකූලතාවය දක්වමින් කාන්තා සර්වජන සංගමය පිහිටුවා ගැණිනි. එම සංවිධානය 1927 දී ඩොනමෝර් කොමිසම ඉදිරියේ කරුණු දැක්වූ අතර 1931 දී ශ්‍රී ලාංකික කාන්තාවද පිරිමින් සමඟ සමව සර්වජන ඡන්ද බලය හිමිකර ගත්හ ( කාන්තා දේශපාලන දැනුම හා සහභාගීත්වය වර්ධනය කිරීම, පුහුණු අත් පොත). නමුත් ස්ත්‍රීන්ට ඡන්ද බලය ලබාදුන්නේ " අවුරුදු 30 ට වැඩි ස්ත්‍රීන්ට පමණක් ඡන්ද බලය හිමිය" යන කොන්දේසිය ගෙන එමින්ය. නමුත් මෙයට විරුද්ධව අවුරුදු 21 ට වැඩි සියළුම ස්ත්‍රීන්ට ඡන්ද බලය ලබාදිය යුතුය කියමින් ගෙන ගිය සටන් ව්‍යාපාර වල ප්‍රතිඵලයක් ලෙස කොමිසමට අවුරුදු 21ට වැඩි සියළුම දෙනාටම ඡන්ද අයිතිය ලබා දීම සඳහා සංශෝධනයක් ගෙන ඒමට සිඳු විය (මඩහපොළ,2004ඃ 14). මේ ආකාරයට ස්ත්‍රීන්ගේ මූලිකත්වයෙන් පිරිමින්ගේ ද සහයෝගය ඇතිව ඔවුන් ගෙන ගිය විශාල සටන් ව්‍යාපාර වල ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන්ට ඡන්ද බලය ලබා ගැනීමට හැකි වීම ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයේ ස්ත්‍රීන් ලැබූ විශාල ජයග්‍රහණයක් ලෙස සඳහන් කළ හැකිය. මෙසේ 1931 ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන්ට ප්‍රථම වරට ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව ලැබුණද 1931 ජූනි මස පැවති මහා මැතිවරණය ඡන්ද කොට්ඨාශ 50 ක් නියෝජනය කරමින් අපේක්ෂකයන් ඉදිරිපත් වුවත් එක් අපේක්ෂිකාවක්වත් මෙම මැතිවරණයට ඉදිරිපත් වී නොමැත වශයෙන් (මඩහපොළ,2004ඃ15) දක්වා ඇත. කෙසේ වුවද 1931 නොවැම්බර් මස 14 දින පැවති අතුරු මැතිවරණයට රුවන්වැල්ල ආසනය නියෝජනය කරමින් ඇඩ්ලින් මොලමුරේ මහත්මිය තරග කරමින් ජයග්‍රහණය කළ අතර ඡන්ද 13866 ක් (මඩහපොළ,2004ඃ15) ලබා ගනිමින් රාජ්‍ය මන්ත්‍රණ සභාව නියෝජනය කළ ප්‍රථම ස්ත්‍රිය වීමේ අවස්ථාව උදාකර ගැනීමට ඇයට හැකි වී ඇත.

එසේ වුව ද වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් අඩකට වැඩි ප්‍රමාණයක් සිටින්නේ කාන්තා ජනගහනයයි. 2011 වාර්ෂික ජන සංගණනයට අනුව එය 51%ක් (පාර්ලිමේන්තු මැතිවරණ ශාඛාව, මැතිවරණ ලේකම් කාර්යාලය)වශයෙන් දක්වා ඇති අතර කාන්තාවන් ආර්ථිකයට ප්‍රධාන වශයෙන් දායකත්වයක් දක්වනු ලැබේ. ශ්‍රී ලංකාවට විදේශ විනිමය ගලා එන ප්‍රධාන ක්ෂේත්‍රයන් තුළ වැඩි ප්‍රමාණයක් නියෝජනය වන්නේ කාන්තා ශ්‍රමය වන අතර කෙසේ නමුත් ස්ත්‍රී දේශපාලන නියෝජනය තුළ පවතින්නේ මන්දගාමී ස්වරූපයකි. වර්තමානය වන විට පහළ මට්ටමේ දේශපාලන ක්‍රියාවලිය තුළ එනම් මැතිවරණ කටයුතු, මැතිවරණ උද්ඝෝෂණ, පක්ෂ සාමාජිකත්වය කාන්තා බල මණ්ඩලය තුළ කැපී පෙනෙන ලෙස ස්ත්‍රී සහභාගීත්වයේ ක්‍රියාකාරී දායකත්වයක් දක්නට ලැබෙන නමුත් දේශපාලන පක්ෂ තුළ හා තීන්දු ගන්නා ව්‍යුහයන් තුළ ස්ත්‍රී නියෝජනය ඉතාමත් අල්පය. එමෙන්ම රටේ ප්‍රතිපත්ති සකස් කරන ඒ පිළිබඳව තීන්දු ගන්නා ප්‍රධානම ව්‍යුහයන් වන දේශපාලන ආයතන තුළ ස්ත්‍රී නියෝජනය ඉතාමත් අඩුය. එහි දී සිදු ව ඇත්තේ ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගෙන සමාජ සංස්කෘතිය විසින් ස්ත්‍රියට වෙනස්කොට සැලකීම හේතු කොටගෙන එම අයිතිය ස්ත්‍රීන්ට අහිමි කිරීමයි.

## පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රී නියෝජනය

පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රී නියෝජනය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී එහි ඓතිහාසික විකාශනය පිළිබඳ අවධානය ඉතා වැදගත් වේ. රාජ්‍ය මන්ත්‍රණ සභාව අහෝසි වීමත් සමග 1947 දී ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණය පැවත්විය. මේ සඳහා අපේක්ෂකයන් තිදෙනෙක් ඉදිරිපත් වූහ. කිරි ඇල්ල ආසනය නියෝජනය කරමින් ඩේසි මරියා ප්ලෝරන්ස් සේනානායක මහත්මියත් (ලංකා සම සමාජ පක්ෂය ) මැද කොළඹ නියෝජනය කරමින් අයේෂා රාවුෆ් මහත්මියත් (ස්වාධීන) අම්බලන්ගොඩ -බලපිටිය නියෝජනය කරමින් ශ්‍රීමනී අභය ගුණවර්ධන මහත්මියත් ඒ අතර විය. අයේෂා රාවුෆ් සහ ශ්‍රීමනී අභය ගුණවර්ධන යන අපේක්ෂිකාවන් දෙදෙනා මෙම මැතිවරණයේ දී පරාජයට පත් වූ අතර ප්ලෝරන්ස් සේනානායක මහත්මිය ප්‍රථම පාර්ලිමේන්තුවේ 95 ක් මන්ත්‍රී මණ්ඩලයේ එකම මන්ත්‍රීවරිය ලෙස තේරී පත් වූවාය (මඩහපොළ, 2004ඃ 17). එම අවධිය තුළ ඇති වූ නිදහස් අරගලවල මූලිකත්වය ගෙන කටයුතු කළ පිලිප් ගුණවර්ධන මහතා අධිරාජ්‍යවාදීන් විසින් සිරගත කිරීමෙන් පසුව 1948 අප්‍රේල් 19 දින පැවති අතුරු මැතිවරණයේ දී ඔහුගේ භාර්යාව වූ කුසුමා ගුණවර්ධන අවිස්සාවේල්ල ආසනයේ මන්ත්‍රීවරිය ලෙස නිතරගයෙන් පත්වූවාය. එම අතුරු මැතිවරණයෙන් මහනුවර ආසනයට තේරී පත් වූ ටී.බී ඉලංගරත්න මහතාගේ මන්ත්‍රී ධූරය ඡන්ද පෙත්සමකින් අහිමිවීම නිසා 1949 ජූනි 18 දින පැවති අතුරු මැතිවරණයේ දී එතුමාගේ භාර්යාව වූ තමරා කුමාරි ඉලංගරත්න මහත්මිය (ස්වාධීන) මහනුවරින් ඡන්ද 10,062ක් (මඩහපොළ,2004ඃ17) ලබාගනිමින් ජයග්‍රහණය කළ අතර එක්සත් ජාතික පක්ෂ අපේක්ෂක ඒ. පී. එල්. රත්වත්ත මහතාට වඩා ඡන්ද 2050 ක් ලබාගත්තාය. 1952 පාර්ලිමේන්තු මහ මැතිවරණය එන තෙක් පළමු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන් තිදෙනෙක් නියෝජනය කළහ. මෙහි විශේෂත්වය වූයේ තේරීපත් වූ නියෝජිතවරියන් තිදෙනාම වාමාංශික පක්ෂ නියෝජනය කළ අය වීමත් කිසියම් වූ දේශපාලන පක්ෂ නියෝජනය කළ අය වීමත් කිසියම් වූ දේශපාලන පවුල් පසුබිමක් මත පැමිණි අය වීමත්ය. 1947 සිට 2015 දක්වා පාර්ලිමේනතුවේ ස්ත්‍රී නියෝජනය හා එහි ප්‍රතිශතයන් පහත වගුවෙන් පැහැදිළි වේ.

වගු අංක 04 ඃ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රී නියෝජනය

| මැතිවරණ වර්ෂය | මුළු මන්ත්‍රීන් සංඛ්‍යාව | මුළු මන්ත්‍රීවරියන් සංඛ්‍යාව | මන්ත්‍රීවරියන්ගේ ප්‍රතිශතය |
|---|---|---|---|
| 1947 | 101 | 3 | 3.0% |
| 1952 | 101 | 2 | 2.0% |
| 1956 | 101 | 4 | 4.0% |
| 1960 (මාර්තු) | 157 | 3 | 1.9% |
| 1960 (ජූලි) | 157 | 3 | 1.9% |
| 1965 | 157 | 6 | 3.8% |
| 1970 | 157 | 6 | 3.8% |
| 1977 | 168 | 11 | 6.5% |
| 1989 | 225 | 13 | 5.8% |
| 1994 | 225 | 12 | 5.3% |
| 2000 | 225 | 9 | 4.0% |
| 2001 | 225 | 10 | 4.4% |
| 2004 | 225 | 13 | 5.8% |
| 2010 | 225 | 13 | 5.8% |
| 2015 | 225 | 13 | 5.8% |

මූලාශ්‍රඃ කොළඹ මැතිවරණ මහ ලේකම් කාර්යාලය, 1947-2015

ශ්‍රී ලංකාව නිදහස ලබා ගැනීමෙන් පසුව ප්‍රථම මහ මැතිවරණය පැවත්වූයේ 1952 වසරේ දීය. මෙහි 1952 පැවති මෙම දෙව පාර්ලිමේන්තු මැතිවරණයට නියෝජිතයින් 95 ක් තේරී පත් වී ඇති අතර ඉන් ස්ත්‍රීන් නියෝජනය වූයේ දෙදෙනෙක් පමණක් බව මෙම වගුවෙන් පැහැදිළි වෙයි. පසුගිය පක්ෂ සමඟ සසඳා බලන විට එය 1% ක අඩු වීමක් පෙන්නුම් කරයි. එසේ පත් වූවන් අතර ලංකා සම සමාජ පක්ෂයෙන් අවිස්සාවේල්ලෙන් කුසුමා ගුණවර්ධන මහත්මියත්, අකුරුස්සෙන් නවක මන්ත්‍රීවරියක් ලෙස කොමියුනිස්ට් පක්ෂයෙන් ඩොරීන් වික්‍රමසිංහ මහත්මියත් පත් විය. 1947 පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් ලෙස සිටි ලංකා සම සමාජ පක්ෂයේ ප්ලෝරන්ස් සේනානායක සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තමරා කුමාරි ඉලංගරත්න මෙම මැතිවරණයේ දී පරාජයට පත් විය. නවක අපේක්ෂිකාවන් ලෙස කිරි ඇල්ලෙන් එක්සත් ජාතික පක්ෂයෙන් තරග කළ ක්ලෝඩා ජයසූරිය, කැලණියෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරග කළ විමලා විජයවර්ධන සහ ලංකා සම සමාජ පක්ෂයෙන් විවියන් ගුණවර්ධන සහ මාවනැල්ලට ස්වාධීනව තරග කළ ඇන්.එච් සීලවතී යන මහත්මීහු පරාජයට පත් වී ඇත (මඩහපොළ,2004ඃ20). 1956 පැවති තුන්වන පාර්ලිමේන්තුවේ 95ක් වූ මන්ත්‍රී මණ්ඩලයේ ස්ත්‍රීන් 4 දෙනෙක් නියෝජනය කළහ. එය 4.2% ක් වූ අතර පසුගිය පාර්ලිමේන්තුවට වඩා 2.1% ක ඉහළ යාමක් පෙන්නුම් කරයි. උතුරු කොළඹින් විවියන් ගුණවර්ධන මහත්මියත් කිරි ඇල්ලෙන් කුසුමා ගුණවර්ධන මහත්මියත් මීරිගමින් විමලා විජේවර්ධන මහත්මියත් ඌව පරණගමින් කුසුමා රාජරත්න මහත්මියත් එම ජයග්‍රහණය කළ අය අතර විය. එක්සත් ජාතික පක්ෂයෙන් තරග කළ ක්ලෝඩා ජයසූරිය සහ විමලා කන්නන්ගර යන මහත්මීහු මෙම මැතිවරණයේ දී පරාජයට පත් වූහ.

වාමාංශික පවුල් පසුබිමක් තුළ හැදී වැඩී වාමාංශික ව්‍යාපාරයේ "ගිණිසිලුව" නමින් හැඳින්වූ විවියන් ගුණවර්ධන මෙම ව්‍යවස්ථාදායකයට තේරීපත් වීමද මෙහි විශේෂත්වය විය. දේශපාලන පවුල් පසුබිමක් මත ඇය දේශපාලනයට පැමිණියත් ඇගේම වූ ස්වාධිනව ගොඩ නගා ගත් නායකත්වයක් ඔස්සේ කටයුතු කිරීම නිසා දේශපාලනය තුළ සිටි බොහෝ ස්ත්‍රීන්ට වඩා වෙනස් මුහුණුවරක් ගැනීම විශේෂත්වයක් විය. බණ්ඩාරනායක මහත්මාගේ නායකත්වයෙන් යුත් ආණ්ඩුව සමයේ පැවති

මෙම පාර්ලිමේන්තුවේ විශේෂත්වයක් වූයේ ප්‍රථම වතාවට ස්ත්‍රියකට ඇමති පදවියක් ලැබීමය. එම අවස්ථාව උදා කර ගැනීමට හැකියාව ලැබුණේ විමලා විජයවර්ධනටය. සෞඛ්‍ය ඇමතිනිය වශයෙන් ක්‍රියා කළ ඇය 1959 ඇමති මණ්ඩල සංශෝධනයෙන් පළාත් පාලන හා නිවාස ඇමති ධූරයට වැඩි ඡන්ද 114531ක් (මඩහපොළ,2004෴21) ලබා ගනිමින් වැලිමඩ ආසනයට තේරී පත් වූවාය. මෙහි දී මෙම පාර්ලිමේන්තු කාලයේ සිදු වූ තවත් සිද්ධියක් වූයේ ඡන්ද පෙත්සමකින් කේ. ඇම්. පී රාජරත්න මහතාට වැලිමඩ ආසනය අහිමි වීම නිසා ඔහුගේ බිරිඳ වන කුසුමා රාජරත්න 1957 සැප්තැම්බර් මස 7 වැනි දින පැවති අතුරු මැතිවරණයෙන් එම අසුන සඳහා පත් වීමයි.

1960 මාර්තු මස පැවති 4 වන පාර්ලිමේන්තුවේ 151ක් වූ මන්ත්‍රී මණ්ඩලයේ ස්ත්‍රීන් නියෝජනය වූයේ තිදෙනෙක් පමණි. ගලිගමුවෙන් එක්සත් ජාතික පක්ෂයෙන් විමතා කන්නන්ගර (1.9%), වැලිමඩින් ජාතික විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් කුසුමා රාජරත්න හා සෝමා වික්‍රමනායක ඒ අතර විය. සෝමා වික්‍රමනායක නවක මන්ත්‍රීවරිය ලෙස පත් විය. මැය ලංකා සම සමාජ පක්ෂය නියෝජනය කරමින් ස්වාධීනව ඉදිරිපත් වුණු ස්ත්‍රියක් ලෙස සඳහන් කළ හැකිය. ඇය ගුරුවරියක ලෙසත් සමස්ථ ලංකා සම සමාජ කාන්තා සම්මේලනයේ ලේකම්වරියක ලෙසත් කටයුතු කළ මැය දෙහිඕවිට නියෝජනය කරමින් දේශපාලනයට පිවිසියාය.

මෙම මැතිවරණය පසුගිය මැතිවරණ සමඟ සසඳා බලන විට ස්ත්‍රී නියෝජනය 2.3% ක අඩු වීමක් පෙන්නුම් කරයි. විවියන් ගුණවර්ධන, කුසුමා ගුණවර්ධන, සහ විමලා විජයවර්ධන යන හිටපු මන්ත්‍රීවරියන් තිදෙනාම පරාජයට පත්විය. නවක අපේක්ෂිකාවන් ලෙස ස්වාධිනව ඉදිරිපත් වූ මැද කොළඹින් වසන්තා අප්පදොරේ, එක්සත් ජාතික පක්ෂයෙන් මහර සිරිදත්තා ජයකොඩි, ලංකා සම සමාජ පක්ෂයෙන් කැලණියෙන් ඇන්. ඇස් පෙරේරා, ලංකා සම සමාජ පක්ෂයෙන් කොළොන්නාව රූපා ගුණවර්ධන, සිංහල ජාතික සංවිධානයෙන් මොරටුව නීතා විජේසූරිය, හක්මනින් පී සෝමාවතී, බදුල්ලෙන් ලිලියන් පීරිස් සහ රත්නපුරෙන් තරඟ වැඳුණු කාමනී මීදෙණිය යන අය පරාජයට පත් විය. මෙම මැතිවරණයේ විශේෂත්වය වූයේ මෙතෙක් පැවති මැතිවරණ වලට වඩා වැඩි අපේක්ෂිකාවන් පිරිසක් ඉදිරිපත් වීමය. 1960 ජූලි, 1961, 1965, 1970, 1977 සිට වර්තමානය දක්වා කාල සීමාව වන තෙක් ස්ත්‍රී නියෝජනය පිළිබඳව සෑහිමකට පත් වීමට නොහැකිය. 1965 හය වන පාර්ලිමේන්තුවේ 151ක් වූ මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් නවක අපේක්ෂකයින් බොහෝ දෙනෙක් ඉදිරිපත් වුවත් ස්ත්‍රීන්ගේ නියෝජනය වූයේ හයක් පමණි (මඩහපොළ,2004෴21). එහි බණ්ඩාරනායක මහත්මිය වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ගෙන විපක්ෂ නායිකාව බවට පත් වීම විශේෂ දෙයක් වන අතර උප ඇමතිවරියන් දෙදෙනෙක් ද පත් විය. මෙහිදී පස්වන පාර්ලිමේන්තුවට වඩා ස්ත්‍රීන් තුන්දෙනෙක් වැඩිවීම නිසා ප්‍රතිශතය 2% දක්වා වැඩි විය. 1970 හත්වන පාර්ලිමේන්තුවේ සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය ඇතුළු ස්ත්‍රීන් හතක් නියෝජනය විය. මෙම පාර්ලිමේන්තු කාල සිමාව තුළ දී අතුරු මැතිවරණ දහතුනක් පවත්වා ඇති අතර එකම අතුරු මැතිවරණයකටවත් ස්ත්‍රී අපේක්ෂිකාවන් ඉදිරිපත් වී නොමැත.

1977 පැවති අටවන පාර්ලිමේන්තුවේ 168ක් වූ මුළු මන්ත්‍රී මණ්ඩලයේ ස්ත්‍රීන් 11 ක් නියෝජනය කෙරිණි.එතෙක් පැවති පාර්ලිමේන්තු තුළ ස්ත්‍රී නියෝජනයන් සසඳා බැලීමේ දී වැඩිම නියෝජනයක් දක්නට ඇත්තේ මෙම අටවන පාර්ලිමේන්තුව තුළය. එය පසුගිය පාර්ලිමේන්තුවට වඩා 2.6% ක වැඩි වීමක් පෙන්නුම් කරයි. 1977 පැවති මහ මැතිවරණයේ දී සිරිමාවෝ බණ්ඩාරනායක,අමරා පියසීලි රත්නායක, සහ රේණුකා හේරත් යන මන්ත්‍රීවරියන් මුලින්ම පත්වූ අතර අනෙක් මන්ත්‍රීවරියන් අට දෙනාම පත් වුයේ එම පාර්ලිමේන්තු කාලය තුළ පැවති අතුරු මැතිවරණ වලදීය. නමුත් 1980 සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීම නිසා ඇයට පාර්ලිමේන්තුවේ නියෝජනය අහිමි වූ අතර මෙයද ශ්‍රී ලාංකීය ස්ත්‍රී දේශපාලනය තුළ දැකිය හැකි තවත් පැතිකඩකි. මෙම අටවන පාර්ලිමේන්තුව ඉතා දීර්ඝ කාලයක් එනම් අවුරුදු 12ක් (1977-1989) පැවති එකම ආණ්ඩුව වේ. මෙය ඡන්ද කොට්ඨාශ මට්ටමින් පැවති අවසාන ඡන්ද විමසීම වීමද ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයේ සන්ධිස්ථානයකි (මඩහපොළ, 2004෴ 25).

1989 පැවති 9 වන පාර්ලිමේන්තු මැතිවරණය පවත්වන ලද්දේ නව ඡන්ද ක්‍රමයක් වන සමානුපාතික ඡන්ද ක්‍රමයක් තුළය. 1977 දී මැතිවරණයේ 168 ක් වු මුළු පාර්ලිමේන්තු නියෝජනය මෙම මැතිවරණයේ දී 225 දක්වා වැඩි කරන ලදී. ඒ තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය 13ක් වූ අතර එය

5.4% ක් විය. එය අටවන පාර්ලිමේන්තුව සමඟ සසඳන විට එය 0.8% කින් අඩු වී ඇත. අවුරුදු හතක් ප්‍රජා අයිතිය අහිමිව සිටි සිරිමාවෝ බණ්ඩාරනායක නැවත දේශපාලනයට පිවිසෙන්නේ මෙම මැතිවරණයේ දීය. 1994 පැවති 10 වන පාර්ලිමේන්තුව පිහිටවනු ලබන්නේ නායකත්වයක් තුළය. 225ක් වූ මුළු මන්ත්‍රී මණ්ඩලය සිරිමාවෝ බණ්ඩාරනායක සහ චන්ද්‍රිකා කුමාරණතුංග මහත්මීන් ඇතුළුව ස්ත්‍රීන් 12ක ගෙන් සමන්විත විය. මෙම සියළුදෙනාම දේශපාලනයට පිවිස ඇත්තේ කිසියම් වූ දේශපාලන පවුල් පසුබිමක් තුළය.

මෙම පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය සම්බන්ධව සාකච්ඡා කිරීමේ දී වැදගත් කරුණු කිහිපයක් ම දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ පළමු අග්‍රමාත්‍යවරිය වූ සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ කණිටු දියණිය වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මහත්මිය දෙවන අග්‍රාමාත්‍යවරිය ලෙස තේරී පත් වීමය. මෙම කාල සීමාව තුළ ඇය ප්‍රථම ජනාධිපතිනිය වශයෙන් ජයග්‍රහණය කිරීමද ශ්‍රී ලාංකේය දේශපාලන ඉතිහාසයේ සුවිශේෂී ස්ථානයකි. මෙහි දී ඒ වන විට ජනාධිපති අපේක්ෂකයෙකුව සිටි ගාමිණී දිසානායක ඝාතනයට ලක් වීමෙන් පසුව ඔහුගේ බිරිඳ වූ ශ්‍රීමා දිසානායක ජනාධිපති අපේක්ෂිකාවක ලෙස ඉදිරිපත් වීමද ස්ත්‍රී දේශපාලනය පිළිබඳ සාකච්චා කිරීමේදී වැදගත් වේ. එයට හේතුව වන්නේ මෙවැනි තත්ත්වයක් තුළ ස්ත්‍රීයකගේ නම යෝජනා කරනුයේ දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනයේ ඇති වැදගත්කම තේරුම් ගනිමින් නොව පටු දේශපාලන අපේක්ෂාවන් මුදුන්පත් කර ගැනීමට ඇති අපේක්ෂාවෙන් ස්ත්‍රීන් අනුකම්පාවට ලක් කරමින් ඒ හරහා තම පක්ෂයේ බලය රැක ගැනීම සඳහා යොදාගන්නා උපක්‍රමයක් ලෙසටය.

2000 පැවති 11 වන පාර්ලිමේන්තුව තුළ 225ක් වූ මන්ත්‍රී මණ්ඩලයේ ස්ත්‍රීන් නියෝජනය වූයේ 9 ක් පමණි. එය 4.0%ක් වන අතර 1994 පාර්ලිමේන්තුවට වඩා 1.3% ක අඩුවීමක් පෙන්නුම් කරයි(මඩහපොළ,2004:26). මෙම පාර්ලිමේන්තුවේ විශේෂත්වය වූයේ ප්‍රථම වතාවට පාර්ලිමේන්තුවේ මුස්ලිම් නියෝජිතවරියක් ලෙස ෆේරියල් අෂ්රොප් පත් වීමයි.එවකට මුස්ලිම් කොංග්‍රසයේ නායකයාව සිටි පාර්ලිමේන්තුව නියෝජනය කළ ඒ.එච්.එම්. අෂ්රොප් මහතාගේ අභාවයෙන් පසුව ඇය තේරීපත් වූවාය. එම කාලය තුළම ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් ඒ.ඩී අන්ජාන් උම්මා මහත්මිය ජාතික ලයිස්තුවෙන් පත්වූවාය. පාර්ලිමේන්තු ඉතිහාසයේ ප්‍රථම වතාවට මුස්ලිම් ස්ත්‍රීන් දෙදෙනෙක් එකම පාර්ලිමේන්තුවේ නියෝජනය විම දක්නට ලැබෙන්නේ මෙම 11 වන පාර්ලිමේන්තුවේ දීය. ඊට අමතරව නවක මන්ත්‍රීවරියන් කිහිප දෙනෙක් පත් විමද දක්නට ලැබේ. රත්නපුරෙන් සුරංගනී එල්ලාවලත් (නන්ද එල්ලාවල-පුතාගේ ඝාතනයෙන් පසු) කුරුණෑගලින් සෝමා කුමාරි තෙන්නකෝන්, පුත්තලමෙන් ශ්‍රියාණි ප්‍රනාන්දු සහ අනුරාධපුරයෙන් චන්ද්‍රාණි බණ්ඩාර ජයසිංහ යන අය ඒ අතර විය. 2001 දී 12 වන පාර්ලිමේන්තු මැතිවරණයේ දී ස්ත්‍රීන් 10 ක් තේරී පත් වූ අතර ඒ අතර නවක මන්ත්‍රීවරියන් වශයෙන් මාතරින් මල්ලිකා ද මැල්, මහනුවරින් චිත්‍රා ශ්‍රීමනී මන්තිලක මහත්මියත් පුත්තලමෙන් මේරි ලැරිස් පෙරේරා යන ස්ත්‍රීන් තේරී පත් විය. එයින් දේශපාලන පසුබිමක් නොමැතිව පැමිණි එකම මන්ත්‍රීවරිය වුයේ චිත්‍රා මන්තිලකයි (මඩහපොළ,2004:26).

2004 වර්ෂයේ අප්‍රේල් මස 2 වැනි දින පැවති 13 වන පාර්ලිමේන්තුව ශ්‍රී ලංකා ඉතිහාසයේ තවත් සන්ධිස්ථානයක් ලෙස සඳහන් කළ හැකිය. පසුගිය ආණ්ඩුවේ විපක්ෂය ලෙස කටයුතු කළ පොදු පෙරමුණු ආණ්ඩුව සහ ජනතා විමුක්ති පෙරමුණ එක් වී එක්සත් ජනතා නිදහස් සන්ධානය නමින් නව පක්ෂයක් හරහා මැතිවරණයට ඉදිරිපත් වීම මෙහි විශේෂත්වය වේ. ඒ හරහා නව ආණ්ඩුවක් පිහිටු වීමට එක්සත් ජනතා නිදහස් සන්ධානයට හැකි විය. එක්සත් ජනතා නිදහස් සන්ධානය යටතේ පිහිට වූ 13 වන පාර්ලිමේන්තුවේ 225 ක ක් වූ මන්ත්‍රී මණ්ඩලයේ ස්ත්‍රීන් 11 ක් විය. ජාතික ලයිස්තුවෙන් නම් කළ මේරි ලුසිඩා පත් කිරීමෙන් පසුව නියෝජනය 12 ක් විය. නමුත් ටික දිනකින් ජාතික ලයිස්තුවෙන් පත් කළ මේරි ලුසිඩාට ජනතාවගෙන් ප්‍රතික්ෂේප වූ තම ස්වාමිපුරුෂයා වූ මර්වින් සිල්වාට මන්ත්‍රීකම දීමට සිදු වූ හෙයින් ඇයගේ මන්ත්‍රීකම අහෝසිවීම තුළ පාර්ලිමේන්තුවේ ස්ත්‍රීන්ගේ නියෝජනය 11 දක්වා අඩුවිය (මඩහපොළ,2004:27).

මෙවැනි පසුබිමක් තුළ ශ්‍රී ලාංකේය දේශපාලනය තුළ වසර 73 ක් පුරාවටම මෙන්ම වර්තමානය දක්වාම සිදුවන්නේ ජාතික ලැයිස්තුව පිරිමි ලැයිස්තුවකට පමණක් සීමා වීමය. ශ්‍රී ලාංකේය ස්ත්‍රී නියෝජනය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී සියලු ජනවර්ගයන්ගේ සම් මිශ්‍රනයක් ස්ත්‍රී

නියෝජනය තුළ ද තිබිය යුතුය යන කරුණ පිළිබඳවය. මෙම 13 වන පාර්ලිමේන්තුව තුළ දෙමළ, මුස්ලිම්, සිංහල යන නියෝජනයක් තිබීම සුවිශේෂී කාරණාවක් විය. යාපනය, මඩකලපුව, රජරට, මාතලේ රත්නපුර යන දිස්ත්‍රික්ක වලින් සිංහල, දමිළ , මුස්ලිම් යන ජන වර්ගයන් නියෝජනය කරමින් 13 වන පාර්ලිමේන්තුවට නියෝජිතවරියන් පත් විය. 2010 වර්ෂයේ දී මෙන්ම 2015 වසරේ පැවත්වූ මැතිවරණ වලදී ද පාර්ලිමේන්තුවේ 225 ක මන්ත්‍රී මණ්ඩලයෙන් ස්ත්‍රීන්ගේ නියෝජනය දක්නට ලැබෙන්නේ නියෝජිතවරියන් 13ක් පමණි. මේ අනුව පෙනී යන්නේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පසුව පළමු පාර්ලිමේන්තුවේ සිට අටවන පාර්ලිමේන්තුව දක්වාම පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් වශයෙන් තේරී පත්ව ඇත්තේ අවම මට්ටමකින් බවකි. එහිදී 2015 මහ මැතිවරණයෙන් පසු රැස්වූ පාර්ලිමේන්තුව දක්වා පුරා වසර තිස් හතක් තුළ කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය සැළකිය යුතු මට්ටමකින් වර්ධනය වී නොමැත.

මෙම 1931 සිට 2004 දක්වා වසර 73 ක පමණ කාලය තුළ ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය පිළිබඳ විමසන විට පෙනී යන කාරණයක් වන්නේ ශ්‍රී ලංකාවේ ජාතික දේශපාලනයට මෙතෙක් පැමිණි ස්ත්‍රීන්ගේ නියෝජනය සම්බන්ධයෙන් කිසිසේත් සෑහීමකට පත් විය නොහැකි අතර රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිට වර්තමානය වන පාර්ලිමේන්තුව දක්වා ස්ත්‍රීන් නියෝජනය වී ඇති ආකාරය දෙස බලන විට පෙනීයන වැදගත්ම කාරණයක් වන්නේ නියෝජිතවරියන්ගෙන් 80% කටත් වඩා ප්‍රමාණයක් දේශපාලනයට පිවිස ඇත්තේ පක්ෂ නායකත්වය මත සමග පැවති කිසියම් වූ පෞද්ගලික හිතවත්කමක් මත එසේ නොමැති නම් ක්‍රියාකාරී දේශපාලන පවුල් පසුබිමක් මත එසේත් නොමැති නම් එම පවුල් වල පියා, ස්වාමි පුරුෂයා, සහෝදරයා නැතිනම් ඥාතියෙකුගේ අභාවයෙන් පසු හෝ ඝාතනයෙන් පසුව නැතහොත් නාම යෝජනා ප්‍රතික්ෂේප වූ අවස්ථාවක දීය. එම තත්ත්වය වර්තමාන පාර්ලිමේන්තුව දක්වාම දැකිය හැකි කාරණයක් වී ඇත.

### පළාත් සභා තුළ ස්ත්‍රී නියෝජනය

1980 දශකය මෙරට දේශපාලනයේ වැදගත් වෙනස්වීම් සිදු වූ වකවානුවක් විය.මෙම වකවානුවේම මෙරට උතුරු නැගෙනහිර අර්බුදයේ විවිධ වෙනස්කම් සිදු කළ දශකයක් විය.මෙම දශකය මුල භාගය ගෙවෙත්ම ලාංකීය උතුරු-නැගෙනහිර ගැටලුවට ඉන්දියානු මැදිහත් වීම ඍජුව දැණුනු වකවානුවක් විය. මේ දශකයේ මෙරට බලයේ සිටි ජේ. ආර් ජයවර්ධන ජනාධිපතිතුමා උතුරු-නැගෙනහිර එල්.ටී.ටී.ඊ ව්‍යාපාරය දුටුවේ ත්‍රස්තවාදී රට බෙදෙන ඊලාම් ව්‍යාපාරයක් ලෙසිනි. " එක්සත් ජාතික පක්ෂය තිබෙන තුරු මේ රටේ ඊලාම් ව්‍යාපාරය හරියන්නෑ. කවුරු එක්කාසු වුනත් කවුරු එකට වැඩ කෙරුවත් එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් තිබුණත් නැතත් ඊලාම් ව්‍යාපාරයට අපි හාත්පසින් විරුද්ධයි. අපි මේ රට බෙදන්න ඉඩ දෙන්නේ නැහැ "(හේමන්ත,2006ඃ69) යනුවෙන් මෙවැනි පදනමක පිහිටා ජයවර්ධන ජනාධිපති වඩමාරච්චි සටන දියත් කොට එල්.ටී.ටී.ඊ යඉතා දුර්වල තත්ත්වයකට පත් කළේය. මේ අවස්ථාවේදී ඉන්දියාව " ඔපරේෂන් ඔෆ් පූමාලෙයි " නම් ක්‍රියාන්විතය තුළින් ලංකාවේ ගැටලුවට ඍජු මෙන්ම හිතුවක්කාරී බලපෑමක් එල්ල කලේය. මේ ආකාරයේ බලපෑම් කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා අවසාන වශයෙන් මෙරට උතුරු-නැගෙනහිර ගැටලුව විසඳීම සඳහා ඉන්දීය රජයේ මැදිහත් වීම ලබා ගත යුතු බවට තීරණය කෙරිණි. එහෙත් මීට එතුමාගේ රජයේ ප්‍රභල ඇමතිවරු විරෝධය පළ කළහ. මේ නිසා 1987 දී මෙරට ඉන්දීය මහකොමසාරිස් ජේ. එන් ඩික්සිට් සහ කුල්දිප් ගයා දේවි හා රොනාවයෙන් යන අයගේ දායකත්වයෙන් ගිවිසුමක් සකස් කලේය. මෙය ඉතා රහසිගත ලියවිල්ලක් ලෙස කෙටුම්පත් වූ අතර 1987 ජූලි 29 ලංකා රජය වෙනුවෙන් ජේ. ආර්. ජයවර්ධන ද, ඉන්දීය රජය වෙනුවෙන් අගමැති රජිව් ගාන්ධිද අත්සන් යොදා විධායක ගිවිසුමක් ලෙස මෙරට බලාත්මක කලේය. ඉන්දු ලංකා ගිවිසුම් ප්‍රකාරව මෙරටට පළාත් සභා ක්‍රමයක් හඳුන්වා දීමට යෝජනා විය. ඒ මත 13 වන ආණුඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත සකසා එය සම්මත කර ගැනීමෙන් පසු මෙරට පළාත් සභා ක්‍රියාත්මක වීම ආරම්භ විය (හේමන්ත,2006ඃ69).

1987 පළාත් සභා පනත යටතේ පිහිටවනු ලැබූ පළාත් සභාවල ප්‍රථම පළාත් සභා මැතිවරණය පවත්වන ලද්දේ 1989 දීය. විවිධාකාරයෙන් රට තුළ සිදුවෙමින් තිබූ මිනීමැරුම් සහ අතුරුදහන් වීම් මධ්‍යයේ ඉතාමත් භීෂණකාරී සමයක එම මැතිවරණය පැවත්විණි. එවකට සටන්කාමී කණ්ඩායමක්

ලෙස කටයුතු කළ ජනතා විමුක්ති පෙරමුණ විසින් "ඡන්දය පාවිච්චි කරන්නවුන්ට මරණීය දණ්ඩනය" වැනි තර්ජන පවා පණවමින් තිබූ තත්ත්වයක් තුළ සමහර පුද්ගලයන් ඡන්දය පාවිච්චි කිරීමෙන් වැළකී සිටියත් මරණීය තර්ජන හමුවේ පවා තමන්ගේ මූලික අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කළ බොහෝ පිරිස් ද වූහ (මධහපොළ,2004ඃ40). මෙවැනි තත්ත්වයක් තුළ එම පළාත් සභා මැතිවරණයට ජනතා විමුක්ති පෙරමුණේ භීෂණය තදින්ම පැවති පළාත්වල බොහෝ දෙනා අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් විමට බියක් දැක්වීය. මේ නිසා ස්ත්‍රීන්ගේ ප්‍රමාණය තවත් වැඩි විය. ඉදිරිපත් වූ අපේක්ෂිකාවන්ගේ ප්‍රමාණය 2.8%ක්විය (මධහපොළ,2004ඃ40). 1993 පැවති මැතිවරණයේ එම ප්‍රමාණය 3.7%ක් (මධහපොළ,2004ඃ40) වූ අතර එම වර්ෂයේ දී සුළු වශයෙන් වර්ධනයක් පෙන්නුම් කරයි.මෙම පළාත් සභා මැතිවරණයේ දී විශේෂත්වය වූයේ ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට පළාත් සභාවක් සඳහා මහ ඇමතිවරියක් පත්විමය. එම අවස්ථාව උදාකර ගත්තේ බස්නාහිර පළාත් සභාවෙන් තේරී පත් වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංගයි.

1993 පැවති පළාත් සභා මැතිවරණයේ දී ස්ත්‍රී නියෝජනය 18 දෙනෙක් වූ අතර එය 1999 වර්ෂයේ 12 දෙනෙක් දක්වා අඩු වී ඇත. 1993 වර්ෂයේ දී වැඩිම මන්ත්‍රීවරියන් පිරිසක් නියෝජනය වී ඇත්තේ බස්නාහිර පළාතෙනි. 104ක් වූ මුළු නියෝජිත සංඛ්‍යාවෙන් ස්ත්‍රීන් පත් වූයේ 7ක් පමණි. එය 6.7% ක් වු අතර 1999 දී එම සංඛ්‍යාව 2 දක්වා අඩු වී ඇත.එම වර්ෂයේ වැඩිම නියෝජනයක් වයඹ සහ මධ්‍යම පළාත් වලින් තේරී පත් වී ඇත. එය එක් පළාතකට තිදෙනෙක් බැගිනි (මධහපොළ,2004ඃ41).

2004 පළාත් සභා මැතිවරණයේ දී කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් 475ක් මුළු අපේක්ෂකයන් ලෙස ඉදිරිපත්ව ඇති අතර ඉන් ස්ත්‍රීන් ඉදිරිපත්ව ඇත්තේ 41 ක් පමණි. පුත්තලම් දිස්ත්‍රික්කයෙන් 286 ක් මුළු අපේක්ෂකයන් අතර ස්ත්‍රීන් වූයේ 10 ක් පමණි. ඒ අනුව වයඹ පළාත් සභාවේ මුළු අපේක්ෂක සංඛ්‍යාව 761ක් වූ අතර අපේක්ෂිකාවන් වූයේ 51 දෙනෙක් පමණි. 50 දෙනෙක් වූ පළාත් සභාවේ මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරියන් වූයේ 4 දෙනෙක් පමණි. ඒ අතර එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් කුමාරි ඒකනායකත් ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් මැණික් ගුණසේකරත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් පත්මා වැත්තැව සහ උපුලාංගනී මාලගමුව යන අය වූහ (මධහපොළ,2004ඃ41).

වගු අංක 05ඃ ශ්‍රී ලංකාවේ පළාත් සභා තුළ ස්ත්‍රී නියෝජනය, 1993-2008/09

| පළාත | 1993 | | | 1999 | | | 2004 | | | 2008/09 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මුළු | ස්ත්‍රීන් | % | මුළු | ස්ත්‍රීන් | % | මුළු | ස්ත්‍රීන් | % | මුළු | ස්ත්‍රීන් | % |
| බස්නාහිර | 104 | 7 | 6.7 | 104 | 2 | 1.9 | 104 | 6 | 5.7 | 104 | 6 | 5.7 |
| උතුරුමැද | 33 | 4 | 12.1 | 33 | 1 | 3.0 | 34 | 1 | 2.9 | 33 | 1 | 3.0 |
| වයඹ | 52 | 3 | 5.8 | 52 | 3 | 5.8 | 52 | 4 | 7.7 | 52 | 3 | 5.8 |
| ඌව | 34 | 0 | 0.0 | 34 | 1 | 2.9 | 34 | 1 | 2.9 | 34 | 1 | 2.9 |
| මධ්‍යම | 58 | 1 | 1.7 | 58 | 3 | 5.1 | 58 | 3 | 5.2 | 58 | 5 | 8.6 |
| දකුණ | 55 | 2 | 3.6 | 55 | 1 | 1.8 | 55 | 1 | 1.8 | 55 | 2 | 3.6 |
| සබරගමුව | 44 | 1 | 2.3 | 44 | 1 | 2.3 | 44 | 1 | 2.3 | 44 | 1 | 2.3 |
| උතුර | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| නැගෙනහිර | - | - | - | - | - | - | - | - | - | 37 | 1 | 2.7 |
| **එකතුව** | **380** | **18** | **4.7** | **380** | **12** | **3.2** | **380** | **17** | **4.5** | **380** | **20** | **4.8** |

මූලාශ්‍රඃ මැතිවරණ දෙපාර්තමේන්තුව, 1993-2009

## පළාත් පාලන ආයතන තුළ ස්ත්‍රී නියෝජනය

ශ්‍රී ලාංකික ජනතාවගෙන් 72% ක් පමණ ග්‍රාමීය වන අතර ගම හා නගරයේ ජීවිත අතර විශාල වෙනසක් පවතී (ලියනගේ, 2011ඃ 9). එයට හේතුව වන්නේ ගමේ ආර්ථිකය මෙන්ම යටිතල

පහසුකම්ද තවමත් දියුණු නොවීමයි. විශාල වශයෙන් මෙම ග්‍රාමීය ප්‍රදේශ විසින් අත් විඳින ගැටලු රාශියක් වන අතර එම ගැටලු වලට පිළියම් ලෙස ඒවාට විසඳුම් ලබා දීමට පළාත් පාලන ආයතන හරහා සිදු කර ගත හැකිය වන අතර ඒ සඳහා ස්ත්‍රීන් ද එම ආයතන සඳහා පත් කර ගත යුතුය. අවම වශයෙන් ගම් මට්ටමේදීවත් ප්‍රජාතන්ත්‍රවාදීව විනිවිද පෙනෙන අයුරින් වගකීමෙන් හා වගවීමෙන් යුතුව නීතියට ගරු කරමින් සැමගේ අයිතීන් හා නිදහස උදෙසා දූෂණය, ප්‍රචණ්ඩත්වය, අවම කොට මහජන දේපළ අපතේ නොයවා පොදු යහපත සඳහා යෙදවීමට නම් වැඩි ස්ත්‍රීන් සංඛ්‍යාවකට මෙම ආයතන තුළ වැඩි නියෝජනයක් ලබා දිය යුතුය. අතීතයේ සිටම ජාතික දේශපාලනය සඳහා ඉදිරිපත් වූ අපේක්ෂිකාවන්ගේ සංඛ්‍යාව අඩු වගේම පළාත් පාලන ආයතන සඳහා ඉදිරිපත් වන සංඛ්‍යාව ඉතාමත් අවමය. 1991 වර්ෂයේ 54 ක් වූ නියෝජිතවරියන්ගේ ප්‍රමාණය 2011 වන විට 86කි. 2006 මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් ස්ත්‍රීන්ගේ සංඛ්‍යාව 74 ක් වූ අතර 2011 වර්ෂය වන විට 12කින් වැඩි වී ඇති නමුදු තරඟ කරන ලද මුළු අපේක්ෂක සංඛ්‍යාව 35,241 කින් කාන්තා නියෝජනය 3,598 ක් පමණි. එය ප්‍රතිශතයක් ලෙස දැක්වුවහොත් 10.21% කි (පළාත් පාලන ඡන්ද විමසීම් අංශය, මැතිවරණ මහ ලේකම් කාර්යාලය). 1991 දී නගර සභා සඳහා වැඩිම අපේක්ෂිකාවන් ප්‍රමාණයක් ඉදිරිපත්ව ඇත්තේ මුස්ලිම් කොංග්‍රසයෙනි. 2002 වර්ෂයේ දී පැවති කොළඹ මහ නගර සභා මැතිවරණය සඳහා නීතිඥ නිමල්කා ප්‍රනාන්දු මහත්මියගේ නායකත්වයෙන් ස්වාධීන ස්ත්‍රී කණ්ඩායමක් ඉදිරිපත් වීම විශේෂ වේ (මඩහපොළ,2004:44). ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයේ ප්‍රථම වතාවට ස්ත්‍රී කණ්ඩායමක් ඉදිරිපත් වීම පිළිබඳ සන්ධිස්ථානයක් වගේම එය විශේෂයෙන් ශ්‍රී ලාංකීය ස්ත්‍රී දේශපාලනයේ ද සන්ධිස්ථානයක් ලෙස දැක්විය හැකිය. වාමාංශික නැඹුරුවකින් යුත් කණ්ඩායමක් විම තවත් විශේෂයක් ලෙස සඳහන් කළ හැකිය. නමුත් පැවතුන තත්ත්වය තුළ කිසිදු අපේක්ෂිකාවකට ජය ගැනීමට නොහැකි විය. කෙසේ වුවද ඔවුන්ගේ ඉදිරිපත් වීම අගය කළ යුතුය. මේ අනුව පෙනී යන කාරණාවක් වන්නේ සෑම පළාත් පාලන ආයතනයක් සඳහාම ඉදිරිපත් වන අපේක්ෂකයන්ගේ ප්‍රමාණයට සාපේක්ෂව ස්ත්‍රී අපේක්ෂිකාවන්ගේ ප්‍රමාණය පිළිබඳව කිසිසේත් සෑහීමකට පත් විය නොහැකි විය. එයිනුත් ප්‍රාදේශීය සභා සඳහා ඉදිරිපත් වන සංඛ්‍යාව ඊටත් වඩා අඩු ය.

විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ දේශපාලන ව්‍යුහයන් තුළ පවතින දුර්වලතාවයන් සහ මැතිවරණ ක්‍රමයේ පවතින දුර්වලතාවයන් ස්ත්‍රීන්ට නාම යෝජනා ලැයිස්තුවට නම් ඇතුළත් කර ගැනීමට බාධකයක්ව පවතියි. ඒ නිසාම එය නියෝජකත්වය කෙරෙහි ද විශාල බලපෑමක් සිදු කරයි. දකුණු ආසියානු රටවල අප්‍රිකානු රටවල, පැසිපික් කලාපීය රටවල හා සමහර බටහිර රටවල පළාත් පාලන ආයතන තුළ ස්ත්‍රී නියෝජනය හා සළකා බැලීමේ දී ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන තුළ ස්ත්‍රී නියෝජනය ඉතාමත් පහළ මට්ටමක පවතියි. මේ අනුව ලංකාවේ ජාතික දේශපාලන තලයේ ස්ත්‍රී නියෝජනයට වඩා පළාත් පාලන ආයතන වල නියෝජනයේ විශාල වූ අඩුවක් දක්නට ලැබේ. අසල් වැසි ඉන්දියාව සමඟ ශ්‍රී ලංකාව සංසන්දනය කිරීමේ දී ලංකාවේ මැතිවරණ සහභාගීත්වය 80% ඉක්මවා යෑම සුවිශේෂී කරුණක් ලෙස සඳහන් කළ හැකිය (වර්ණපාල,1995:82). නමුත් 80% ඉක්මවා මැතිවරණ සහභාගීත්වය තිබුණද දේශපාලන ආයතන මෙන්ම රාජ්‍ය ප්‍රතිපත්ති තීරණයේ දී මහජනතාව නියෝජනය කරමින් ස්ත්‍රී නියෝජිතවරුන්ගේ නියෝජන ප්‍රමාණය අවම වීම විශාල වූ දුර්වලතාවයක් ලෙස හඳුන්වා දිය හැකි කරුණකි.

මේ සෑම කරුණකින්ම පෙනීයන කාරණාවක් වන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සකස් කරන හා ඒ පිළිබඳ ව තීන්දු ගන්නා සෑම දේශපාලන ආයතනයක් තුළම (පාර්ලිමේන්තුව, පළාත් සභා, මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා) ස්ත්‍රී නියෝජනයේ විශාල අඩුවක් ඇති බවටය. මෙය වඩාත් යහපත් පාලන ක්‍රමයක් පවත්වාගෙන යාම කෙරෙහි බලපාන ප්‍රධානතම සාධකයක් වෙයි. ඒ වගේම රටේ සංවර්ධන ක්‍රියාවලියට ද එය බාධාවකි. එම නිසා මෙය ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන ගැටලුවක් වේ.

වගු අංක 6ඃ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන තුළ ස්ත්‍රී නියෝජනය 1991-2011

| **පළාත් පාලන ආයතනය** | **1991** | | | **1997** | | | **2006** | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **මුළු මන්ත්‍රීන්** | **ස්ත්‍රීන්** | **%** | **මුළු මන්ත්‍රීන්** | **ස්ත්‍රීන්** | **%** | **මුළු මන්ත්‍රීන්** | **ස්ත්‍රීන්** | **%** |
| මහ නගර සභා | 201 | 6 | 2.9 | 252 | 9 | 3.4 | 330 | 10 | 3.0 |
| නගර සභා | 235 | 6 | 2.4 | 331 | 9 | 2.6 | 379 | 13 | 3.4 |
| ප්‍රදේශීය සභා | 2632 | 42 | 1.6 | 3137 | 55 | 1.7 | 3243 | 51 | 1.6 |
| **එකතුව** | 3068 | 54 | 1.8 | 3720 | 73 | 1.9 | 3952 | 74 | 1.8 |

මූලාශ්‍රඃ මැතිවරණ දෙපාර්තමේන්තුව, 1991-2011

2011 වර්ෂයේ පැවති පළාත් පාලන ඡන්දයේ දී 4465 ක මුළු මන්ත්‍රීන් ප්‍රමාණයක් තේරී පත් වූ අතර එයින් ස්ත්‍රීන්ගේ ප්‍රමාණය වූයේ 86 ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස සඳහන් කිරීමේ දී 1.93 කි (2011 මැතිවරණ ප්‍රතිඵල, කොළඹ මැතිවරණ දෙපාර්තමේන්තුව). මෙයින් පෙනී යන කරුණ වන්නේ ජාතික මට්ටමේදී පමණක් නොව ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය පළාත් පාලන ආයතන තුළ ද ඉතාමත් පහළ අගයක් ගන්නා බවය.

## කාන්තාවගේ දේශපාලන සහභාගීත්වය සඳහා බලපාන සාධක

### ස්ත්‍රිය සම්බන්ධව පවතින සමාජ සංස්කෘතික ආකල්ප

දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ස්ත්‍රිය සම්බන්ධව පවතින සමාජ සංස්කෘතික ආකල්ප පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ. සමාජ සංස්කෘතිය මඟින් ස්ත්‍රිය හා පුරුෂයා අතර ඇති කර ඇති වෙනස (ස්ත්‍රී පුරුෂ සමාජභාවය - GENDER) නිසාම කාලාන්තරයක් තිස්සේ ස්ත්‍රිය හදා වඩා ඇත්තේ පිරිමියාට වඩා වෙනස් ආකාරයකටය. පවුල තුළ ඇය දියණියක්, සහෝදරියක්, මවක්, බිරිඳක් ලෙස පවුලේ පිරිමියෙකු යටතේ කටයුතු කළ යුතුය යන සමාජ ආකල්පය මත වන අතර ගෙදර දොර කටයුතු දරුවන් හදා වඩා ගැනීම ඇතුළු පවුලේ සියළු කටයුතු ඇය මත පැවරුණි. ඇරිස්ටෝටල් පවසන්නේ " ගැහැණුන් පිරිමින්ට වඩා ස්වභාවයෙන්ම පහත් බවයි ". එම නිසා ඔවුන් ස්වභාවික වශයෙන් පිරිමින් විසින් පාලනය කරනු ලබන බවයි. ස්ත්‍රීන් හා පුරුෂයින් අතර අසමානකම් පවත්නා බව සැලකිල්ලට ගන්නා අතර ඔහු ඊට පිළියම් වශයෙන් කළ හැකි කිසිවක් නැති බව පවසයි. මක් නිසාද යත් දේශපාලන යුක්තිය තිබිය හැක්කේ එක සමාන අය අතර පමණක් බැවිනි. එක සමාන රටවැසියන් වශයෙන් පාලනය කිරීම හා පාලනය කරනු ලැබීම අතින් එක සමාන කොටසක් හිමි අය අතර පමණක් බැවිනි. නොරටවැසි තත්ත්වයට ගැහැණුන් තල්ලු කර දැමීමෙන් පසු ඔහු, ගැහැණුන් වෙනුවෙන් කළ හැක්කේ රූපක යුක්තියක් බව කියයි. නමුත් මෙහිදී ඔහු රූපක යුක්තිය යනු කුමක්දැයි පැහැදිළි කිරීමට අසමත් වූ ඔහු දේශපාලන යුක්තියට වඩා ගෘහස්ථ යුක්තියක් ගැන සාකච්චා කර තිබේ (තිරුචන්ද්‍රන්, 1998ඃ2 ). නිවසින් පිටත කටයුතු සඳහා කුඩා කළ සිටම යොමු කරවන්නේ පිරිමි දරුවන්ය. මේ නිසා ඔහුට සමාජයේ බොහෝ දෑ ඉගෙන ගැනීමට අවස්ථාවක් සහ ඉඩකඩක් ලැබිණි. මේ තත්ත්වය මත ස්ත්‍රියගේ තත්ත්වය ඊටත් වඩා හාත්පසින්ම වෙනස් විය. ඇය පොදු කටයුත්තකට සහභාගී වුවහොත් එය සමාජය පිළිනොගත් සම්ප්‍රදායන්ට පටහැනි කටයුත්තක් නම් ඇය සමාජ සම්මතයන්ට පටහැනිව කටයුතු කරන ස්ත්‍රියක් ලෙස දකියි.ඒ වාගේම දියණියක, සොහොයුරියක, බිරිඳක, මවක ලෙස සමාජය පිළිගත් කාර්යයන් ඉටු නොකර, වගකීම් පැහැර හරින්නියක ලෙසද සමාජය බලයි. මෙම සමාජ සම්මතයන් හා පිළිගැනීම් නිසා තමන්ට කොතරම් වුවමනාවක් කැමත්තක් තිබුණද බොහෝ ස්ත්‍රීන් දේශපාලනය වැනි පොදු කාර්යයන් වල නිරත වීමට අකමැත්ත දක්වයි.

එසේම නගරබඳ කාන්තාවන්ට වඩා ගම්බඳ කාන්තාවන්ට මෙම තත්ත්වය විශේෂයෙන් බලපානු ලබයි. මෙම සමාජ සම්මතයන්ට පිටු පා දේශපාලන කටයුතු වල යෙදීමට කොතරම් කැමත්තක් වුවමනාවක් තිබුණත්, පවුලේ සහ දරුවන්ගේ කටයුතු, වෙනත් ප්‍රජා සම්බන්ධතා පවත්වාගෙන යාම ආදී කටයුතු වල යෙදීමට යෙදීමට සිදුවීම නිසා ඒ සඳහා සහභාගී වීමට ඇති අවස්ථාවන් සීමිත වන අතර මෙම කාර්යයන් වලට අමතරව නිවසින් බැහැර රැකියාවක් කරන්නේ නම් එය තවත් දුෂ්කර කාර්යයක් වේ. එමෙන්ම " ස්ත්‍රිය කායික මෙන්ම මානසිකවත් දුර්වල අහිංසක, මෘදු මොලොක් තවත් කෙනෙකුගේ (පිරිමියෙකුගේ) රැකවරණය ඇතිව සිටිය යුතුය " යන සමාජයේ ප්‍රචලිත සාවද්‍ය ආකල්ප නිසා බොහෝ පවුල් වල ඇයට තනියෙන් නිවසින් පිටත වැඩවලට සම්බන්ධ වීමේ අවස්ථාවන් අහුරා ඇත.

බොහෝ අවස්ථා වල සමහර ආගම් තුළ ස්ත්‍රීන් සම්බන්ධව පවතින නීති රීති මෙන්ම පසුගාමී සමාජ සංස්කෘතික හේතූන් ද දේශපාලනය තුළ විවිධ ස්ත්‍රීන්ට නියෝජනය වීමේ අවස්ථාවන් අහුරා ඇත. එසේ විවිධ ජනවර්ග හා විවිධ ආගමික මත දැරීම බරපතල ගැටලුවකි. ඒ ඒ ජාතීන්ගේ සංස්කෘතීන් වගේම එක් ජනවර්ගයක් විසින් තවත් ජනවර්ගයක් සඳහා සිදු කරන වෙනස් කොට සැලකීම් ද ස්ත්‍රී නියෝජනයේ අවම තත්ත්වයට හේතුවක් වී ඇති අතර එය බොහෝ විට විවෘතව සාකච්චාවට බඳුන් වන්නක් නොවේ. ශ්‍රී ලංකාවේ ලිංගිකත්වය පදනම් කරගෙන සිදු කෙරෙන මෙම වෙනස් කොට සැලකීම් අතීතයේ සිටම සිදු වන්නකි. ඡන්ද නාම ලේඛණයට ඇතුළත් කළ නොහැකි කවුරුන්ද කියා 1910 අංක 13 දරණ ආඥාවෙන් නම් කර තිබූ කාරණ තුන අතර කාන්තාවක් වීම යන කාරණය ලෙස දක්වා තිබීමෙන්ද එය වඩාත් තහවුරු වේ(මඩහපොළ,(2004)ඃ81). සමහර අවස්ථාවන් හි දී ස්ත්‍රියට මැතිවරණ වලදී ජයග්‍රහණය ලබා ගැනීම සඳහා පවුලේ හො වෙනත් අයෙකුගේ සහායක් ලබා ගැනීමේ හැකියාවක් ඇති ස්ත්‍රීන් අතලොස්සක්ට පමණි. ස්ත්‍රිය සම්බන්ධයෙන් පවතින මෙම සමාජ සංස්කෘතික ආකල්ප පුවත්පත් ආදී විවධ ප්‍රකාශන හරහා ද තහවුරු කර ඇත. උදාහරණ වශයෙන් ෂේක්ෂ්පියර් මහතා විසින් රචිත හැම්ලට් නැමති නාට්‍යයෙහි කියා ඇත්තේ මෙසේය. “Firalty, thy íme is Women” “ චපලත්වය ඇගේ නම ස්ත්‍රියයි ” (මඩහපොළ,2004ඃ82). එම නිසා දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය අඩු වැඩි වීම කෙරෙහි බලපා ඇති ප්‍රබල සාධකයක් ලෙස මෙම ස්ත්‍රිය සම්බන්ධව පවතින සමාජ,සංස්කෘතික සාධක දැකිවිය හැකිය. දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය අවම වීම සඳහා ලංකාවේ ගැටලුවක් වී ඇත්තේ ස්ත්‍රීන්ට දේශපාලන ක්‍රියාවලියට නොපැමිණීම සඳහා බලපාන සාධක කීපයක් පවතින බවය. එය සංකල්පනාත්මක රාමුවක් අනුසාරයෙන් දැක්වීමේ දී පහත පරිදිය. ඒ සඳහා බලපාන සාධක ස්වායත්ත විචල්‍යයෙන් දක්වා ඇති අතර එම සාධකයන් තව දුරටත් පවත්වාගෙන යාම තුළින් හෝ එම සාධක ඉවත් කිරීම තුළ දේශපාලනය තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය අඩු වැඩි වීම සිදුවේ. සටහනේ පරායත්ත විචල්‍ය ලෙස දක්වා ඇත්තේ එයයි.

වගුව අංක 7: සංකල්පනාත්මක රාමුව

| ස්වායත්ත විචල්‍ය | පරායත්ත විචල්‍ය |
|---|---|
| ස්ත්‍රීන් සම්බන්ධව පවතින සමාජ,සංස්කෘතික ආකල්ප | දේශපාලන ආයතන තුළ ස්ත්‍රී නියෝජනය |
| දේශපාලන තරඟයේ දී සිදු වන චරිත ඝාතන | |
| දේශපාලන පක්ෂ ව්‍යුහයන් පුරුෂ මූලික වීම | |
| දේශපාලන පවුල් පසුබිම | |
| පවතින මැතිවරණ ක්‍රමය | |
| දේශපාලන ප්‍රචණ්ඩත්වය | |
| අත්දැකීම් සහ පුහුණුව අඩුවීම | |
| ආර්ථික අපහසුතා | |

මූලාශ්‍රයඃ මඩහපොළ, 2004ඃ 50

## පවතින මැතිවරණ ක්‍රමය

සර්වජන ඡන්ද බලය හඳුන්වා දුන් පසුව ශ්‍රී ලංකාවේ භාවිත කළ මැතිවරණ ක්‍රමය වන්නේ සරල බහුතර නියෝජන ක්‍රමයයි. පසුව 1978 දී දෙවන ජනරජ ආණ්ඩුක්‍රමයත් සමඟ මැතිවරණ පවත්වන නියෝජන ක්‍රමයේ වෙනසක් සිදු කරන අතර වර්තමානය වන විට ද පවතින්නාවූ නියෝජන ක්‍රමය වන සමානුපාතික නියෝජන ක්‍රමය එයයි. 1978 ලංකාවට හඳුන්වා දුන් සමානුපාතික නියෝජන ක්‍රමය තවදුරටත් ස්ත්‍රීන්ට දේශපාලන ක්ෂේත්‍රයට ඇතුළු වීමේ අවකාශය සීමා කර ඇති අතර මෙම ක්‍රමයට අනුව විශාල දිස්ත්‍රික්කයක ගෘහස්ථ පරිසරයක අඩු අත්දැකීම් සහිත හැදුණු වැඩුණු ස්ත්‍රියකට මැතිවරණ ප්‍රචාරක කටයුතු සහ සංවිධාන කටයුතු කිරීම් දී පිරිමින්ට වඩා විශාල අභියෝගයන්ට මුහුණ පෑමට සිදු වෙයි. ජපානය, ඕස්ට්‍රේලියාව වැනි රටවල මෙම සමානුපාතික ඡන්ද ක්‍රමය හඳුන්වා දීමත් සමඟම ස්ත්‍රී නියෝජනය සැලකිය යුතු ආකාරයකින් වර්ධනය වීමක් දක්නට ලැබුණත් ශ්‍රී ලංකාවේ දේශපාලන තත්ත්වයේ වෙනසක් සිදු නොවුණි (මඩහපොළ,(2004)ඃ92). විශේෂයෙන්ම සමානුපාතික මැතිවරණ ක්‍රමය තුළ පවතින මනාප ක්‍රමය පක්ෂ අතරත්, පක්ෂ අභ්‍යන්තරයේත් විශාල ගැටළු, අභියෝගාත්මක තත්ත්වයකට පත්ව ඇත. මේ නිසාම පක්ෂ තුළ පවතින අක්‍රමිකතාත් නියෝජනයට අවස්ථා ලබා ගැනීමට බාධකයක්ව පවතී. අනුපාත ක්‍රමය එක් අතකින් යහපත් වුවත් තවත් අතකින් ගැටලු සහගත තත්ත්වයන් ඇති කරයි.

මෙම හේතුව නිසා බොහෝ රටවල් තම රටවල පවතින මැතිවරණ ක්‍රමය තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය වර්ධනය කිරීම ඉතාමත් අපහසු බව තේරුම් ගෙන තාවකාලික ව කෝටා ක්‍රමය, ඡන්ද නාමලේඛන වලට ස්ත්‍රීන් නියෝජනය වන ආකාරයට නාම යෝජනා ලැයිස්තු සැකසීම ආදිය හදිසියේ කළ යුතු කාර්යයක් ලෙස භාවිතා කරයි. ශ්‍රී ලංකාවේ ද වරින් වර කිහිපවතාවක්ම මෙවැනි යෝජනා ඉදිරිපත් කළද ඒ පිළිබඳව මෙතෙක් කිසිදු සැලකිල්ලක් දක්වා නොමැත.

## ඡන්දදායක චර්යාව

ඡන්දදායක චර්යාව ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය සඳහා බලපාන සාධක අතර ප්‍රධාන වන අතර ඒ වගේම දේශපාලන තරඟයේ දී සිදු වන චරිත ඝාතන,දේශපාලන ප්‍රචණ්ඩත්වය, අත්දැකීම් පුහුණුව අඩු විම, ආර්ථික අපහසුතා, ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම යනාදිය ප්‍රධාන වේ.පක්ෂ දේශපාලනය තුළ පවතින ඉතාමත් තරඟකාරී තත්ත්වය නිසා එක් පක්ෂයක් විසින් තවත් පක්ෂයකට කරන මඩ ගැසීම් මෙන්ම විශේෂයෙන්ම පක්ෂ-පක්ෂ අතර පුද්ගලයන් හට කෙරෙන චරිත ඝාතන ද බහුලය. එදා පක්ෂ අතර පැවති මෙම බල අරගලය වර්තමානය වන විට පක්ෂ අභ්‍යන්තරයේ පවතින බල අරගලයක් බවට පරිවර්තනය වී ඇත්තේ පවතින මැතිවරණ ක්‍රමය තුළ ඇති මනාප තරඟය නිසාය. මේ තුළ විශාල ලෙස චරිත ඝාතන සහ මඩගැසීම් සිදු වේ. ඒ අතර දේශපාලනයට පිවිසෙන ස්ත්‍රීන්ට ඒ සඳහා කෙරෙන චරිත ඝාතන හා මඩ ගැසීම් බහුලය. මෙම තත්ත්වය අතීතයේ ඡන්ද අයිතිය ලබා ගැනීම සඳහා සටන් කළ ස්ත්‍රීන්ට මෙන්ම වර්තමානය වන විට ජාතික තත්ත්වයේ සි ග්‍රාමීය මට්ටමේ දේශපාලනය කරන ස්ත්‍රිය දක්වාම අඩුවක් නැතිව ඒ ආකාරයෙන් ම සිදු වේ. එදා ඡන්ද අයිතිය සම්බන්ධව ස්ත්‍රීන් අරගල කරන අවස්ථාවේ දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරයෙකු වූ සර් පොන්නම්බලම් රාමනාදන් මහතා මෙසේ කියා ඇත.

"ස්ත්‍රීන්ට ඡන්ද බලය ලබා දීම ඌරන් ඉදිරියට මුතු විසිකිරීම වැනි ක්‍රියාවකි." යනුවෙන් සඳහන් කර තිබේ (මඩහපොළ,2004ඃ83). එම උපහාසාත්මක කතාවෙන් අතීතයේත් ස්ත්‍රීන් කොතරම් දුරට අවඥාවට ලක් කර ඇත් ද යන්න පැහැදිළි වේ. එම අවධියේ දී ම තවත් පුවත්පතක මෙසේ සඳහන්ව තිබිණි. " පොදු යහපත සඳහා සහයෝගයෙන් ක්‍රියා කිරීමට ස්ත්‍රීන්ට නොහැකි නම් මගේ අදහස වන්නේ. ඔවුන් දේශපාලනයට බැස සැමදෙනා ඉදිරියේ විහිළුවක් බවට පත් නොවී, තම ගෙදර දොර වැඩක් බලාගෙන සිටීම යෙහෙකි බවයි " (අල්විස්, ජයවර්ධන,සහ අනෙකුත් අය,2001ඃ14). මෙම ආකාරයට අතීතයේ මෙන්ම වර්තමානය තුළත් දේශපාලනයට පිවිසි ස්ත්‍රීන් හැල්ලුවට ලක් කිරිම නිසා සමහර ස්ත්‍රීන් සටන් ව්‍යාපාර වලින් ඈත් වුවත් තවත් සමහරු ස්ත්‍රීන් එම අභියෝගවලට මුහුණ දෙමින් ඉදිරියට ගියහ. මෙම මිත්‍යා සංකල්පයන්ට සමහර අවස්ථාවල ස්ත්‍රීන් මෙසේ ප්‍රතිචාර දක්වා ඇත. වෙස්ම්බෲක්-ඉංග්‍රීසි ජාතික හිල්ඩා කුලරත්න විවාහයට පෙර මෙසේ සඳහන් කර ඇත. "ගැහැණුන්ට අයිති කුස්සියයි. ප්‍රතිවාදියා විසින් නිශ්ශබ්ද වුවොත් ඔවුන්

තවදුරටත් කියන්නේ මෙයයි. ඇය ඡන්දය දෙන්නේ මොන එහෙකටද? ගෙදර වැඩ කටයුතු හැර වෙන දේවල් කරන්නේ කුමකටද? හොඳටම දන්නවානේ පැරණි කියමන " තොටිල්ල පදවන අත ලොව ආණ්ඩු කරයි." තවත් මොනවද ඕනෑ කරන්නේ. ඔවුන් හිතන්නේ මෙයින් විවාදය අවසන් බවයි. මෙසේ තර්ක කරන පිරිමින්ට නොවැටහෙන කාරණය නම් ස්ත්‍රියගේ ස්ථානය වන්නේ ගෙදර නම් එය පුරුෂයන්ගේ ස්ථානයද වන බවයි. රාජ්‍යයන් සමන්විත වන්නේ තනි තනි ගෙවල් එකතුවීමෙන් නොවේ ද? එසේ නම් ඒ සම්බන්ධ කටයුතු නිවාස ඇති පුරුෂයන්ට මෙන්ම ස්ත්‍රීන්ටද මූලික වශයෙන් අදාළ වන්නක් නොවේද?" යනුවෙනි (මඩහපොළ,2004:84). එයට ප්‍රති උත්තර වශයෙන් පොන්නම්බලම් රාමනාදන් මෙසේ කියා ඇත. " ස්ත්‍රීන්ගේ සම්පූර්ණ ජීවිතයම තම නිවස වෙනුවෙන් කැප කිරීමට සිදු වීම නිසා අපි ස්ත්‍රීන් නිවසටම සීමා කිරීමට ඉඩ දිය යුත්තෙමු දෙවියන් වහන්සේගේ සැලස්ම කිසිසේත් අවුල් නොකළ යුත්තේය. එයට නිවැරැදිව අවනත විය යුතුය" (මඩහපොළ,2004:84) යනුවෙන් සඳහන් කර තිබේ. මෙවැනි ප්‍රචාරයන් මඟින් මුළු ස්ත්‍රී පරපුරම අවඥාවට ලක් කරන අතරම ස්ත්‍රිය සම්බන්ධයෙන් පවතින ආකල්පයන් තවදුරටත් ඒ ආකාරයෙන්ම තහවුරු කිරීමට ගත් උත්සාහයන් මනාව පැහැදිළි වේ. ශ්‍රී ලංකාවේ ජනාධිපතිනිය ලෙස කටයුතු කළ චන්ද්‍රිකා කුමාරතුංග සහ ජාතික තලයේ සහ පළාත් මට්ටමේ දේශපාලන නියෝජිතවරියන් ජනමාධ්‍ය හරහා විශාල චරිත ඝාතනයන්ට ලක් කරන අතරම ග්‍රාමීය දේශපාලන ක්‍රියාකාරිනියන් ලෙස කටයුතු කළ ස්ත්‍රීන්ව ද ප්‍රසිද්ධියේ ඉතා නින්දිත මඩ ප්‍රහාරයන්ට ලක් කරයි. පසුගිය කාලය තුළ " වැන්දඹුවන්ගේ දේශපාලනය" කියන කාරණය පුරුෂ දේශපාලනය තුළ අවඥාවට ලක් කර ඇත. උදාහරණයක් ලෙස ගාමිණී දිසානායක ඇමතිවරයාගේ අභාවයෙන් පසු ජනාධිපති ධූර අපේක්ෂිකා ලෙස තරඟ බිමට වැදුණු එතුමාගේ භාර්යාව වන ශ්‍රීමා දිසානායකට ස්වාධීන ජනාධිපති ධූර අපේක්ෂක ඒ. ජේ රණසිංහ මහතා ජනමාධ්‍යයට මෙසේ ප්‍රකාශ කර තිබේ. " සැමියාගේ මිනියේ උණුසුම යන්නට පෙර දේශපාලනයට පිවිසෙන කාන්තාවන් සිටින්නේ කොයි රටේ ද?" යනුවෙන් සඳහන් කරන අතර රාවය පුවත්පතේ ලිපියක් පළ කරන මොහු තව දුරටත් සඳහන් කරන්නේ "ළඟදීම ශ්‍රී ලංකා රජය කනවැන්දඹු පක්ෂ නියෝජිත රජයක් ලෙස ගිනස් පොතට ඇතුළත් වන බව "කියමින් අනාවැකියක් පළ කර කර තිබේ.එහි තවත් තැනක සඳහන් කර තිබෙන්නේ "මන්ත්‍රීවරයෙකුගේ බිරිඳකට මන්ත්‍රීවරියක් වීමේ දොළදුක ඇති වුවහොත් එම මන්ත්‍රීවරයාට දෙයියන්ගේම පිහිටයි" යනුවෙන් දක්වා ඇත (මඩහපොළ,2004:85). ප්‍රසිද්ධ මාධ්‍යයක් වන බී බී සී ප්‍රවෘත්ති සේවයෙ 'චන්ද්‍රිකා කුමාරතුංග සහ ශ්‍රීමා දිසානායක ජනාධිපතිවරණයට ඉදිරිපත් වී තරඟ වැදීම"Battle of the Widows" ලෙසින් පටු උපහාසාත්මක ලෙසින් දේශපාලනයට පිවිසෙන ජාතික තලයේ ස්ත්‍රීන්ද හැල්ලුවට ලක්කෙරිණි (මඩහපොළ,2004:85). අතීතයේ මෙන්ම වර්තමානය තුළදී ද මෙවැනි චරිත ඝාතනයන් සිදු කිරීම අවම වීමකට වඩා දැකිය හැක්කේ මෙවැනි සිදු වීම් දැඩි වශයෙන් සිදු වීමය.

පවතින මැතිවරණ ක්‍රමය තුළ ගත වුණු දශක කිහිපය තුළ සාමකාමී දේශපාලන ක්‍රියාවලියක් සිදුවනවා වෙනුවට දැකිය හැකි වූයේ බලය මත පදනම් වූ ප්‍රචණ්ඩකාරී දේශපාලන ක්‍රියාදාමයක් මුළු සමාජය පුරාම ක්‍රියාත්මක වීමය. මිනීමැරුම්, දේපළ විනාශ කිරීම්, රැකියා අහිමි කිරීම් රැකියා ස්ථාන මාරු කිරීම් ආදී වශයෙන් ශාරීරික හා මානසික වශයෙන් සිදු කරන ප්‍රචණ්ඩත්වය ද අනෙකුත් ප්‍රචණ්ඩත්වයන් මෙන්ම දිනෙන් දින ඉහළ යමින් පවතී. මෙම තත්ත්වයන් වෙනස් කර සාමකාමීව ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයේ මැතිවරණ පැවත්වීමට කටයුතු කරනවා වෙනුවට වගකිව යුත්තන් ද කටයුතු කරනුයේ එම ප්‍රචණ්ඩ ක්‍රියාවන් සඳහා තව තවත් අනුබල දීමයි. මෙසේ ප්‍රචණ්ඩ ක්‍රියා දිනෙන් දින වැඩි වීමට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ එවැනි ක්‍රියා වල යෙදෙන අපේක්ෂකයන්ට නීතියේ රැකවරණය ලැබීමත් එවැනි ක්‍රියා වල යෙදෙන අපේක්ෂකයන්ට නැවත අපේක්ෂකයන් ලෙස ඉදිරිපත්වීමට නීතියෙන් මෙන්ම පක්ෂ ප්‍රතිපත්ති තුළත් කිසිදු තහනමක් නොවීමය. පිරිමින් මෙම ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙමින් කටයුතු කළත් එවැනි තත්ත්වයක් තුළ ස්ත්‍රීන් දේශපාලනය කරනවාද යන්න පිළිබඳව දෙවරක් සිතා බලයි. හේතුව ස්ත්‍රිය ස්වභාවයෙන්ම ප්‍රචණ්ඩත්වයට අකමැති නිසාය. ලාංකීය දේශපාලනය තුළ ප්‍රචණ්ඩ ක්‍රියාවන් රාශියක් සිදු වී තිබේ.උදාහරණ වශයෙන් 2004 වර්ෂයේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ නිරීක්ෂණ වාර්තා වලට අනුව එම වර්ෂයේ මැතිවරණය තුළ (2004) පාර්ලිමේන්තුව විසුරුවා හැරිය දින සිට පූර්ව මැතිවරණ (2004 අප්‍රේල් 01 දිනට) ප්‍රචණ්ඩ ක්‍රියා 1747 ක් වාර්තා වී ඇති අතර ඉන් බරපතල ක්‍රියා 643ක් සිදු වී ඇත (මඩහපොළ,2004:93). මැතිවරණ දින (2004 අප්‍රේල් 2) ප්‍රචණ්ඩ

ක්‍රියා 452ක් සිදු වී අතර ඉන් ඡන්ද මධ්‍යස්ථාන අසල 381 ක් සිදු වී ඇත.මැතිවරණ දිනයෙන් පසු දින සිට පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා 108 ක් වාර්තා වී ඇති අතර ඉන් 46 ක් බරපතල සිද්ධීන් විය. මෙසේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා පූර්ව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා, මැතිවරණ දිනය තුළ සිදු වන ප්‍රචණ්ඩ ක්‍රියා සහ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා ආදී වශයෙන් විවිධාකාරයෙන් දිනෙන් දින මැතිවරණයට වැඩි වෙමින් පවතියි. 2004 මැතිවරණය සිදු වූ විශේෂ දෙයක් වන්නේ එම මැතිවරණය තුළ වයඹ පළාත් සභා අපේක්ෂිකාවක් වූ සෝමා කුමාරි තෙන්නකෝන් මහත්මියට එක්සත් ජාතික අපේක්ෂකයින් විසින් පහර දී රෝහල් ගත කිරීමක් ද සිදුවීමයි.

මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියාවන් හේතුවෙන් ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ස්ත්‍රීන්ව දේශපාලනයෙන් තව තවත් ඈත් කර තැබීමට බලපාන්නාවූ ප්‍රබල සාධකයක් වේ (මධහපොළ,2004:93). මෙසේ ප්‍රචණ්ඩ ක්‍රියා දිනෙන් දින වැඩි වීමට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ එවැනි ක්‍රියාවල යෙදෙන්නන්ට නීතියේ රැකවරණය ලැබීමත් එවැනි ක්‍රියාවල යෙදෙන අපේක්ෂකයන්ට නැවත අපේක්ෂකයින් ලෙස ඉදිරිපත් වීමට නීතියෙන් මෙන්ම පක්ෂ ප්‍රතිපත්ති තුළත් කිසිදු තහනමක් නොවීමත්ය. 1997 වර්ෂයේ පැවති වයඹ පළාත් සභා මැතිවරණය තුළ දී ඉතිහාසයේ වෙන කිසිම දිනක සිදු නොවූ ආකාරයට ස්ත්‍රීන්ට ඉතාමත් අප්‍රසන්න පහත් නින්දිත ක්‍රියාවන්ට (නිරුවත් කිරීම් වැනි ක්‍රියාවන්ට) ප්‍රසිද්ධියේ මුහුණ දීමට සිදු විය. මෙවැනි තත්ත්වයන් නිසා ස්ත්‍රීන් තව තවත් දේශපාලන ක්‍රියාවලියෙන් ඈත් වීමට කටයුතු කරනවා විනා ඒ තුළ රැදී සිටීමට හෝ වැඩි සහභාගිත්වයක් ලබා දීමට කටයුතු නොකරයි. ඒනිසා ස්ත්‍රීන් ස්වභාවයෙන් ම ප්‍රචණ්ඩ නොවීමත්, ප්‍රචණ්ඩත්වයට අකමැති වීමත් නිසා ස්ත්‍රී නියෝජනය වැඩි කිරීමට අවශ්‍ය පියවර ගන්නේ නම් මෙවැනි ප්‍රචණ්ඩත්වයන් අවම වීම තුළින් දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය වැඩි වීමට හේතුවක් වන අතර එමගින් යහපත් පාලන තන්ත්‍රයක් ඇති වීම කෙරෙහි ද යම් බලපෑමක් සිදු කරනු ලබයි (මධහපොළ,2004:94).

මෙතෙක් දේශපාලන ආයතන තුළ නියෝජනය වන ස්ත්‍රීන් වැඩි පිරිසක් දේශපාලනයට පිවිස ඇත්තේ පවුල් සබඳතාවක් තුළිනි. බොහෝ පිරිමින් තරුණ වියේ සිටම දේශපාලන නායකයන් සමග පළාත් පාලන ක්ෂේත්‍රයේ කටයුතු වලට සම්බන්ධ වෙමින් නියලෙමින් එමෙන්ම වෘත්තිය සමිති, ශිෂ්‍ය ව්‍යාපාර ආදියෙහි නායකත්වය දරමින් ලැබූ අත්දැකීම් මත දේශපාලනය තුළ වැඩි ක්‍රියාකාරීත්වයක් දක්වති. නමුත් මෙම අවස්ථාවන්ගෙන් කුඩාකළ සිටම අපේ සමාජ සංස්කෘතිය විසින් ස්ත්‍රීන් ඈත් කර තබන නිසා එවැනි අත්දැකීම් සහ පුහුණු ලබා ගැනීමේ අවස්ථාවන් ඇහිරී ගොස් ඇත. මේ නිසාම දේශපාලන වාද විවාද වලට සම්බන්ධ වීම, ප්‍රසිද්ධ රැස්වීම් වල දේශන සාකච්ඡා පැවැත්වීම, ජනමාධ්‍ය භාවිතය ආදී කටයුතු සම්බන්ධයෙන් ද අත් දැකීම් අඩුය. එවැනි හැකියාවන් ඇති අයට පවා ඔවුන්ගේ කාර්ය බහුලත්වය නිසාම එම අවස්ථාවන්ට ඉදිරිපත්වීමේ අවස්ථාවන් ඇහිරී ගොස් ඇත. ඒ නිසාම නායකත්ව වගකීම් දැරීමේ ඉඩ අවස්ථාවන් ද විරලය. එවැනි අවස්ථාවනුත් උදා කර ගත හැකිව ඇත්තේ සමාජයේ එක්තරා ඉහළ පවුල් පසුබිමක් තුළ හැදුන වැඩුන ස්ත්‍රීන් සීමිත පිරිසකටය. එසේ අත්දැකීම්, පුහුණුව, නායකත්වය වැනි ගුණාංග නොමැතිව වෙනත් බලපෑම් වලින් දේශපාලන කරලියට ආවත් දේශපාලනිකව නිවැරදි තීරණ ගැනීමට ඇති නොහැකියාව ආදී කරුණු නිසාම ඇයට වෙනත් ගැටලු වලටද මුහුණ පෑමට සිදු වේ. මෙය දේශපාලන ක්‍රියාවලියට පිවිසීම බලාපොරොත්තුවෙන් සිටින අනිකුත් ස්ත්‍රීන්ට ද ලැබිය යුතු අවස්ථාවන් අහිමි වීමට හේතුවක් වන අතර මෙම තත්ත්වයන් විශේෂයෙන් පුරුෂයන්ට එතරම් බලපෑමක් සිදු නොකරයි.

ස්ත්‍රී නියෝජනය කෙරෙහි බලපෑම් කරන සාධකයක් ලෙස දිළිදු භාවය නැතහොත් ආර්ථික අපහසුතා නම් කාරණය බලපෑම් කරනු ලබයි. පවතින ක්‍රමය තුළ සෑම ඡන්ද අපේක්ෂකයෙකුටම මැතිවරණ කටයුතු සඳහා විශාල වියදමක් දැරීමට සිදුව ඇත. බොහෝ අවස්ථා වල නියෝජිතයෙකු වශයෙන් පත් වීමට නම් යම් ප්‍රමාණයකින් විශාල මුදල් ප්‍රමාණයක් වැය කිරීමට සිදු වෙයි. පුරුෂ කේන්ද්‍රගත දේශපාලනය ඔවුන් අභිබවා යාමට නම් යම් ප්‍රමාණයක සම්පත් ප්‍රමාණයක් ස්ත්‍රීන් සතුව තිබිය යුතුය. ජනගහනයෙන් වැඩි පිරිසක් ස්ත්‍රීන් සිටිනවා වගේම දුප්පත්කමින් වැඩි පිරිසක් වන්නේ ද ස්ත්‍රීන්ය. ලංකාව තුළ පවතින ආර්ථික රටාව තුළ උරුමයෙන් හිමි වූ දේපලක් හැරුණු විට ස්ත්‍රීන්ට ස්වාධීනව ධනවත් වීමේ අවස්ථාවන් බොහෝ අඩුය. ඒ වගේම ඇය සතු දේපළ

විවාහයෙන් පසුව පවුලේ දේපලක් බවට පත්වේ. ඒ නිසා දේශපාලනය සඳහා පිවිසෙන ස්ත්‍රීන්ට තම පවුල සතු සම්පත් ස්වාධීන ව වියදම් කිරීමට හැකියාවක් නොමැත. නමුත් පිරිමියාගේ තත්ත්වය මීට වඩා වෙනස්ය. පවුලේ සම්පත් උපයන්නා වගේම පවුලේ ගෘහ මූලිකයා පිරිමියා වන අතර ඔහුට වුවමනා ආකාරයට ස්ත්‍රියගේ අවසරයක් නොමැතිව සම්පත් වියදම් කිරීමේ හැකියාවක් ඇත. නමුත් ස්ත්‍රියට එවැනි සම්පත් ලබා ගැනීමේ ක්‍රමයක් පක්ෂ තුළ හෝ වෙනත් ක්‍රම තුළ සොයා ගැනීම ඉතා දුෂ්කර වී ඇත. වර්තමානය වන විට පවතින දේශපාලනය ක්‍රමය තුළ අපේක්ෂකයෙකු විසින් වියදම් කළ යුතු ප්‍රමාණයෙහි සීමාවක් නොමැති නිසා ද මුදල් වැඩිපුර වියදම් කළ හැකි අපේක්ෂකයින්ට වැඩි වාසි අත්කර ගැනීමේ ඉඩකඩ වැඩිය. මේ නිසාම මුදල් වල සීමාවක් ඇති කිරීම තුළින් අනවශ්‍ය ආකාරයෙන් කෙරෙන මිදල් නාස්තිය අවම කර ගත හැකි වන අතරම මැතිවරණ අපේක්ෂිකාවන් සඳහා රජයෙන් යම් අරමුදලක් ලබා දීම ඔවුන් ධෛර්යමත් කරවන්නක් විය හැකිය. පවතින දේශපාලන පක්ෂ ව්‍යුහයන් පුරුෂ මූලික වීම ද ස්ත්‍රී දේශපාලන නියෝජනය කෙරෙහි බලපෑම් කරන සාධකයක් වන් අතර පක්ෂ තුළ සෑම ව්‍යුහයක් තුළම ඇති ප්‍රධාන නිලතල සියල්ලම පිරිමි නියෝජනයකින් සංයුක්ත නිසා ඔවුනට වුවමනා ආකාරයට පක්ෂ කටයුතු හැසිරවෙන බවක්ද දැකිය හැකි කාරණයකි. විශේෂයෙන් දේශපාලන පක්ෂවල සාමාජිකත්වය, අපේක්ෂකත්වය ලබා දිම, පක්ෂ සංවිධායකයින් තේරීම, පක්ෂ රැස්වීම් පවත්වන වේලාවල් ආදිය පිළිබඳව ස්ත්‍රීන්ගේ අවශ්‍යතා හැකියා සහ අදහස් සැළකිල්ලට නොගෙන සියළු කටයුතු සම්බන්ධයෙන් පුරුෂයින්ට වුවමනා ආකාරයට තීන්දු ගැනිම පක්ෂ අභ්‍යන්තරයේ පවතින අතර එය ස්ත්‍රීන්ට බලවත් අසාධාරණයක් ලෙස සඳහන් කළ හැකිය.

තවද ස්ත්‍රී දේශපාලන නියෝජනයේ දි ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය වැඩි වීම සඳහා ඇයගේ ග්‍රාමීය බව හා නාගරික බව යන සාධකය ද බලපෑම් සිදු කරනු ලබයි. ග්‍රාමීය මට්ටමේ දී ස්ත්‍රීන් දේශපාලන කටයුතු සඳහා වැඩි නැඹුරුවක් දක්වන ආකාරයක් දකින්නට ලැබෙන අතර නමුත් ස්ත්‍රීන් මැතිවරණ සඳහා අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් වීම හා නියෝජිතයන් ලෙස තේරී පත් වීම දක්නට ලැබෙන්නේ අවම මට්ටමකිනි. ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය කෙරෙහි විමසීමක් කර බලන විට පෙනී යන කාරණයක් වන්නේ ස්ත්‍රීන් දේශපාලනයට පැමිණිමට දේශපාලන පවුල් පසුබිම යන සාධකය පදනම් වී ඇති බවය. දේශපාලනයේ යෙදෙන පිරිස් නාගරික ප්‍රදේශ වල ජීවත් වීම දක්නට ලැබෙන අතර දේශපාලන අපේක්ෂිකාවන් ලෙස එම පවුල් වලින් ස්ත්‍රීන් ඉදිරිපත් වීම දක්නට ලැබෙන කාරණාවක් ලෙස සඳහන් කළ හැකිය. මෙවැනි කරුණු රාශියක් ශ්‍රී ලාංකේය දේශපාලනය තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය කෙරෙහි හේතු වී තිබේ.

## නිගමනය

මෙම පරිච්ඡේදය තුළින් ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය පිළිබඳව අවධානය යොමු කළ අතර එහිදී ස්ත්‍රීන්ගේ නියෝජනය පාර්ලිමේන්තුව තුළ සිදු වූයේ කෙසේ ද පළාත් සභා තුළ හා පළාත් පාලන ආයතන තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය කෙබඳු ස්වරූපයක් ගනු ලබන්නේ ද යන්න පිළිබඳ ව සාකච්චා කර ඇති අතර ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය කෙරෙහි බලපාන ලබන සාධක වන ස්ත්‍රිය කෙරෙහි පවත්නා සමාජ, සංස්කෘතික ආකල්ප පිළිබඳවත් පවතින මැතිවරණ ක්‍රමය මේ සඳහා බලපෑම් කරන්නේ කෙසේද යන්නත් ඡන්දදායක චර්යාව ඒ සඳහා දායක වන ආකාරය පිළිබඳවත් සාකච්චා කර ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ


මඩහපොළ, තුෂාරි., 2004. *ශ්‍රී ලංකාවේ දේශපාලන ආයතන තුළ ස්ත්‍රී නියෝජනය*, සූරිය ප්‍රකාශකයෝ.

ලියනගේ, කමලා, 2011., *ශ්‍රී ලාංකික ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය*, පේරාදෙණියඃ සාමය සහ යහපාලනය සඳහා වූ කාන්තාවෝ, .

ලියනගේ, කමලා., 2012. *ස්ත්‍රී පුරුෂ දේශපාලන නියෝජනය සමානද? පංගු ක්‍රම න්‍යාන සහ භාවිතය*, කොළඹ: ෆ්‍රෙඩ්රිච් ඊබට් ස්ටිෆ්ටුන්

හේමන්ත, නුවන්., 2006. *පළාත් සභා ක්‍රමයෙන් නිරූපණය වන ප්‍රාදේශීය නියෝජනය*, කර්තෘ ප්‍රකාශනයකි.

තිරුචන්ද්‍රන්, සෙල්වි., 1998. *ස්ත්‍රී පුරුෂ සමාජභාවීය බලගමයතා සහ පශ්චාත් විජිතමය ශ්‍රී ලංකාවේ ස්ත්‍රී සමාජ නියෝජනය*, කොළඹ: කාන්තා අධ්‍යාපන හා පර්යේෂණ කේන්ද්‍රය

www.silumina.lk

Hettiarachchi, R. ,(2016). *Women's Presentation in Local Governance in Sri Lanka* (Introduction). Discussion on 'Women's Representation in Local Governance in Sri Lanka' at Hotel Renuka, Colombo